ස්ථානීය පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලසුම
**(SSE & SMP)**

# වැඩබිම් අංක.16
# කැටන්දොළ, රත්නපුර දිස්ත්‍රික්කය - පැකේජය 1

**අගෝස්තු 2018**

ශ්‍රී ලංකා නායයාම් අවම කිරීමේ ව්‍යාපෘතිය
ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව
**(AIIB)**

වෙනුවෙන් පිළියෙළ කරන ලදී

**සකස් කළේ:**

පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
**99/1,** ජාවත්ත පාර
කොළඹ **05**

*දුරකථන: 011-2588946, 011-2503431, 011-22500354*

පටුන


1. හැඳින්වීම........................................................................................................ 1

2. ස්ථානය පිලිබඳ විස්තරය සහ වැඩබිම් විස්තරය ............................................................ 1

3. නායයෑම් උවදුර සිද්ධිය පිලිබඳ විස්තර........................................................................ 2

4. නායයෑමට ලක්වූ ප්‍රදේශය සහ අවට ඇති ප්‍රදේශ පිළිබඳ විස්තරය සහ වර්ථමාන අවදානම් තත්වය.. 4

5. ව්‍යාපෘති ක්‍රියාකාරකම් මගින් බලපෑමට ලක්විය හැකි අවට පරිසරයේ සංවේදී අංග පිළිබඳ තොරතුරු ......................................................................................................... 5

6. ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩ පිළිබඳ විස්තරය .................. 5

7. අදාළ සමාජීය හා පාරිසරික බලපෑම් හා අවදානම් හඳුනා ගැනීම ........................................ 5

7.1 ධනාත්මක බලපෑම................................................................................... 5

7.2 ඍනාත්මක බලපෑම්.................................................................................. 5

8.2.1 ඉඩම් සහ අනාගත සංවර්ධන ක්‍රියාකාරකම් අහිමි වීම ............................................. 5

8.2.2 පාරිසරික, ජෛව විද්‍යාත්මක බලපෑම්, සත්ව හා ශාක විශේෂ ...................................... 6

8.2.3 කලාපයේ ජලාපවහන රටාව මත ඇතිවන බලපෑම් .................................................. 6

8.2.4 ඛාදන බලපෑම් සහ ජල ප්‍රවාහයන්හි පතුල වෙනස් වීම ............................................. 6

8.2.5 ඉදිකිරීම් ක්‍රියාකාරකම් වලින් සිදු වන ජල දූෂණය ................................................ 6

8.2.6 ඉදි කිරීම් අදියර තුළදී මළ පහකිරීම් නිසා ජලය මඟින් වන ආසාදනය පැතිරීම ................. 6

8.2.7 පහල ප්‍රදේශ වල ජලය භාවිතයට ඇතිවන බලපෑම ................................................. 6

8.2.8 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ඇතිවන ගැටළු ........................................................ 7

8.2.9 වායු දූෂණය බලපෑම් ..................................................................................... 7

8.2.10 ශබ්දය දූෂණය, කම්පන, පිපිරීම්, ඉදිකිරීම් කටයුතු අතරතුරදී ඇතිවන බලපෑම්, ගොඩනැගිලි වලට ඇති විය හැකි හානි, යටිතල පහසුකම් ............................................................ 7

8.2.11 වැඩබිමෙහි සේවකයන් සහ වැඩබිම ආසන්නයේ ජීවත්වන ජනතාව අතර ඇතිවන ආරවුල් හා සම්බන්ධතා .................................................................................................. 7

8.2.12 වැඩ බිම් වාඩි සහ ගබඩා ස්ථාන ...................................................................... 7

8.2.13 ඉදි කිරීම් කටයුතු අතරතුරදී සාමාන්‍ය ජනතාව වැඩබිමට ඇතුළුවීමේ අවදානම................... 7

8.2.14 පුපුරන ද්‍රව්‍ය සහ අනතුරුදායක ද්‍රව්‍ය ........................................................... 7

මෙම ව්‍යාපෘතිය අතරතුර තද පාෂාණ පුපුරවා ඉවත් කිරීම අපේක්ෂා නොකෙරේ............................ 7

8.2.15 ඉදිකිරීම් කටයුතු වලින් මහජනතාවට ආරක්ෂාව: මගීන් සඳහා අවදානම ............................ 7

8.2.16 ඉදිකිරීම් වලදී සේවකයන්ගේ ආරක්ෂාව ............................................................. 7

8. පවත්වනු ලැබූ හා / හෝ පවත්වනු ලැබීමට නියමිත මහජන හා පාර්ශ්වකරුවන්ගේ උපදේශන වැඩමුළු........................................................................................................ 8

8.1 උපදේශනයන සඳහා සහභාගී වූ පාර්ශ්වකරුවන්, උපදේශනයන්හි දී ලබාගත් නිර්දේශ හෝ ගිවිසුම් (ඇමුණුම II බලන්න).................................................................................. 8

9. වැදගත් පාරිසරික හා සමාජ ගැටළු.............................................................................. 8

10.1 ජලය හෝ තෙත් බිම් කෙරෙහි ඇතිවන බලපෑම් (වැඩබිමෙන් පහල ප්‍රදේශයේ පිහිටා ඇති ජල මාර්ග, ගංගා හා අනෙකුත් ජල සම්පත් වෙනස් කිරීම හෝ දූෂණය කිරීම සම්බන්ධ ගැටළු). මෙහි

නායයාම සහිත  භූමියෙහි ඉදිකිරීම් / පිළිසකර කිරීම තුළින් ඇතිවන දිගුකාලීන බලපෑම් සහ අනාගත බලපෑම සහ අවදානම් ඇතුළත් වේ: ..... 8

10.2 බාදන බලපෑම් සහ ඇල පතුල වෙනස් වීම ..... 8

10.3 ප්‍රවාහන යටිතල පහසුකම් සඳහා ඇතිවන බලපෑම් (විශේෂයෙන් තාවකාලික මාර්ග හා දුම්රිය මාර්ග අවහිර වීම්, රථවාහන තදබදය පිළිබඳ අවදානම) ..... 8

10.4 වැඩබිමෙන් පහල ප්‍රදේශයේ ඇති සේවා සඳහා වන බලපෑම් (ජල සැපයුම, අපවහන, විදුලිය ආදිය) ..... 8

10.5 වැඩබිමට යාබදව හෝ ආසන්නයේ (බැවුම ඉහල, බැවුම පහල, බවුමෙන් පහල ප්‍රදේශය ආදිය) ඇති ඉහල අවදානමක් සහිත හෝ මධ්‍ය පරිමාණ අවදානම් සහිත ප්‍රදේශ වල ජීවත් වන ගෘහ ඒකක ..... 9

10.6 ප්‍රදේශය තුළ ව්‍යාපාර, කෘෂිකාර්මික හෝ වෙනත් කටයුතු සඳහා භාවිතා කරනු ලබන ප්‍රදේශයන් පුනුරුත්තාපනය ..... 9

10.7 වැඩබිමට ආසන්නයේ ඇති කෘෂිකාර්මික හෝ වෙනත් කටයුතු සඳහා භාවිතා කරනු ලබන ප්‍රදේශයන් ..... 9

10.8 ජනතාවට වැඩබිමට ඇතුළු වීමට හෝ හරහා ගමන් කිරීමට ඇති අවශ්‍යතාවන් ..... 9

10.9 ප්‍රමුඛ සෞඛ්‍යආරක්ෂිත ගැටළු; කොන්ත්‍රාත්කරුවන් සඳහා වන සම්මත කොන්ත්‍රාත් අවශ්‍යතා වලින් ඔබ්බට යන විශේෂිත පියවර ගැනීමට සිදුවන අනන්‍ය සෞඛ්‍යාරක්ෂිත ගැටළු ..... 9

10.10 ළමා ශ්‍රමය යොදාගැනීම සහ බලහත්කාරීව ශ්‍රමය යොදාගැනීම ..... 9

11 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවසරය, විරුද්ධතාවක් නොමැතිබව, කැමැත්ත සහ අනුමැතිය ..... 9

11.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ..... 9

11.2 රජයේ ඉඩම් වල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කිරීම ..... 9

11.3 පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අනුමත කිරීම ..... 10

11.4 අනෙකුත් අනුමැතීන් ..... 10

11.5 කැමැත්ත/ විරෝධයක් නොමැති බව පලකෙරෙන පුද්ගලික ඉඩම් හිමියන්ගේ නීත්‍යානුකූල එකඟතාවය ..... 10

12. පාරිසරික සමාජ කළමනාකරණ සැලසුම (ESMP) ..... 11

12.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම ..... 11

12.2 මිනිසුන් ඉවත් කිරීම: වැඩෙබිමෙන් හෝ වැඩබිමට ආසන්නව පිහිටා ඇති ප්‍රදේශයෙන්, බැවුම ඉහල/පහල අධි අවදානම් කලාපයෙන් හෝ වැඩබිමට පහල ප්‍රදේශ වලින් ජනතාව ඉක්මනින් ඉවත් කිරීමට සකස් කර ඇති ක්රමවේදය ..... 11

12.3 හානි වූ ව්‍යුහයන්, පහසුකම් හා යටිතල පහසුකම් ඉවත් කිරීම සඳහා ක්‍රියා පටිපාටිය ..... 11

12.4 ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් දේපල / භාවිතයන් අහිමි වීම සඳහා වන්දි ඉල්ලා සිටීමට අවශ්‍යතාවන් ..... 11

12.5 පහත දැක්වෙන අංශ සඳහා මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබා දීම අවශ්‍ය කෙරේ. 11

12.6 සැලසුම් පාදක පාරිසරික / සමාජ කළමනාකරණ සලකා බැලීම් ..... 12

12.7ඉදිකිරීම් අදියර තුළදී වන බලපෑම් අවම කිරීම ..... 13

12.7.1 ඉදිකිරීම් අදියර තුළ පාරිසරික හා සමාජ කළමනාකරණ අවශ්‍යතාවන්ට අනුකූල වීම සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සුදුසුකම් ..... 13

12.7.2 වැඩබිමට විශේෂිත අවධානම් අවම කිරීම ..... 14

12.7.3 වැඩබිමට අදාල නිරීක්ෂණ අවශ්‍යතාවන් ..... 16
**13. වැඩබිම සඳහා දුක් ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය** ..... 17
**14. තොරතුරු අනාවරණය කිරීම** ..... 17
**ඇමිණුම I: ව්‍යාපෘති ප්‍රදේශයේ ඩ්‍රෝන දර්ශණයක්** ..... i
**ඇමිණුම II: වැඩබිමේ තත්ත්වය හා උපදේශනය** ..... ii
**ඇමිණුම III: පාර්ශ්වකරුවන්ගේ උපදේශනය පිළිබඳ වාර්තාව: රත්නපුර දිස්ත්‍රික්කය** ..... iii
**ඇමිණුම IV: රජයේ ඉඩම් හිමියන්ගෙන් සහ පාරිසරික ආයතනවලින් අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත ක්‍රමවේදය** ..... v
**ඇමිණුම V: අධ්‍යයන කණ්ඩායම** ..... vi
**ඇමිණුම VI:** යොමු ලැයිස්තුව ..... vii

## රූප ලැයිස්තුව

රූප සටහන 1: වැඩබිමේ ගූගල් පිළිබිඹුව ..... ii
රූප සටහන 2a: සෙමින් පහළට චලනය වන බෑවුම හේතුවෙන් හානියට පත් මාර්ගය ..... 3
රූප සටහන 2b: දැනටමත් පහලට තල්ලු වූ කොටසේ ස්ථායිකරණ කටයුතු RDA මඟින් කෙරෙන අයුරු ..... 3
රූප සටහන 2c: ඉහළ බෑවුමෙන් ගලා එන ජලය පොදු නාන ස්ථානයක් නිර්මාණය කර ඇති අයුරු ..... 3
රූප සටහන 2d: නාය නිසා අබලන් වූ මාර්ග කොටස සහ ගිලා බැස ඇති පහත බෑවුම් කොටස ..... 3
රූප සටහන 3: භූමියේ චලනය නිසා බලපෑමට ලක්වූ බෑවුම් ප්‍රදේශය සහ ගොඩනැගිලි දැක්වෙන රූපසටහන ..... 4

## වගු ලැයිස්තුව

වගුව 1: අනුමැතිය සඳහා නියමිත කාල නියමය ..... 10
වගුව 2: සැලසුම් අදියරෙදී සලකා බැලෙන පාරිසරික හා සමාජීය කරුණු ..... 12
වගුව 3: සමාජයීය හා සෞඛ්‍ය සහ ආරක්ෂණ වැඩපිළිවල සඳහා කොන්ත්‍රාත්කරුගේ සුදුසුකම් ..... 13
වගුව 4: ස්ථානීය පාරිසරික සමාජයීය සහ සෞඛ්‍යාරක්ෂක අවම කිරීමේ පියවර ..... 14
වගුව 5: පාරිසරික හා සමාජ අධීක්ෂණ සැලසුම; ඉදිකිරීම් අදියර ..... 16
වගුව 6: තොරතුරු අනාවරණය කිරීමේ යෝජනා ක්‍රමය ..... 17
වගුව 7: උපදේශන ආයතන හරහා රැස් කරන ලද තොරතුරු මට්ටම ..... 18

## කෙටි යෙදුම්

| | |
|---|---|
| AIIB | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය |
| DFC | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| DS | ප්‍රාදේශීය ලේකම් |
| DWLC | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| EH & S | පාරිසරික සෞඛ්‍ය හා සමාජ |
| E & SU of PMU | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික හා සමාජ ඒකකය |
| E & S & H & S unit of PMU | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික හා සමාජ සහ සෞඛ්‍ය සහ ආරක්ෂක ඒකකය |
| ESMF | පාරිසරික හා සමාජ කළමනාකරණ රාමුව |
| ESMP | පාරිසරික සමාජ කළමනාකරණ සැලසුම |
| SSE & SMP | ස්ථානීය පාරිසරික සහ සමාජයීය කළමනාකරණ සැලසුම |
| GN | ග්‍රාමනිලධාරී |
| GOSL | ශ්‍රී ලංකා රජය |
| GSMB | භූ විද්‍යා හා පතල් කාර්යාංශය |
| LRC | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව |
| NBRO | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය |
| RDA | මාර්ග සංවර්ධන අධිකාරිය |

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා රජය විසින් ලංකාවේ පළාත් 06 ක දිස්ත්‍රික්ක 11 ක් පුරා පැතිරී පවතින අධික අවදානම් සහිත ප්‍රදේශ වල අස්ථාවර බෑවුම් ස්ථාවර කිරීම / නිවැරදි කිරීම සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙන් (AIIB) ණය මුදලක් ලබා ගැනීම අපේක්ෂා කරයි. මෙම ව්‍යාපෘතිය (AIIB) හි හා ශ්‍රී ලංකා පරිසර හා සමාජ ආරක්ෂණ නීතිරීතිවලට අනුකූලව ක්‍රියාත්මක කළ යුතුය. ව්‍යාපෘතියේ ස්වභාවය සහ ව්යාපෘති ක්‍රියාවලියේ ස්වභාවය සැලකිල්ලට ගනිමින්, AIIB විසින් එහි පාරිසරික හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති වලට සරිලන පරිදි පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවක් (ESMF) සකස් කර ඇත.

පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුව (ESMF) හි අරමුණු වන්නේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී AIIB හි සහ ජාතික පාරිසරික හා සමාජ වගකීම් ආරක්ෂණ යෙදීම සඳහා මාර්ගෝපදේශ සැපයීමයි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සෑම අදියරක දී ම ESMF යටතේ සකස් කරන ලද පාරිසරික සහ සමාජයීය කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය (ජා.ගො.ප.ස.) බැඳී සිටියි. මෙමගින් ව්‍යාපෘතිය මඟින් පරිසරයට සහ ප්‍රජාවට ඇතිවන බලපෑම අවම කිරීමට බලාපොරොත්තු වෙයි.

විෂය ප්‍රමාණය නිර්ණය කිරීමේ වැඩසටහනේදී හෙලිවූයේ පාරිසරික හා සමාජීය සැකසීම්, සෞඛ්‍ය සහ ආරක්ෂක තත්ත්වයන් ස්ථානීය වන අතර වැඩබිම් තත්වයන්ට නිශ්චිතවම අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. එමනිසා ESMF විසින් එක් එක් වැඩබිම සඳහා විශේෂිත පාරිසරික සහ සමාජයීය කළමනාකරණ සැලසුම් සහ විශේෂිත පාරිසරික සහ සමාජ තක්සේරුවක් නිර්දේශ කර ඇත (SSE & SMP). (SSE & SMP) විසින් ක්‍රම සම්පාදනය, සැලසුම් කිරීම, ඉදිකිරීම සහ ක්‍රියාකාරී අවධියට සම්බන්ධ පරිසරය, සමාජීය, සෞඛ්‍ය සහ ආරක්ෂාව කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග සඳහා දායකත්වය ලබා දෙයි.

**මෙහි දක්වා ඇත්තේ කැටන්දොළ නායයාම් අවම කිරීමේ වැඩබිම සඳහා ස්ථානීය පාරිසරික සහ සමාජයීය කළමනාකරණ සැලසුමයි. ගැඹුරු පාරිසරික හා සමාජ තක්සේරුවක් මගින් මෙම සැලසුම සකස් කර ඇත්තේ පහත කරුණු ගැන සැලකිලිමත් වෙමිනි.**

i. ව්‍යාපෘතියෙන් බලපෑම් ඇතිවන ප්‍රදේශයේ ඇති පාරිසරික සහ සමාජීය වශයෙන් සංවේදී අංග හඳුනාගැනීම
ii. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන සැලකිය යුතු පාරිසරික හා සමාජීය බලපෑම් හඳුනා ගැනීම
iii. අවම කරන පියවර යෝජනා කිරීම
iv. මෙම ව්‍යාපෘතියට අදාල වන පාරිසරික සහ සමාජ නිරීක්ෂණ අවශ්‍යතා තීරණය කිරීම
v. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අදාළ වන පාරිසරික රෙගුලාසි හා ක්‍රියා පටිපාටීන් අධ්‍යයනය කිරීම

## 2. ස්ථානය පිලිබඳ විස්තරය සහ වැඩබිම් විස්තරය

වැඩබිම් යොමුව: වැඩබිම් අංක 16 පැකේජය - 1, රත්නපුර දිස්ත්රික්කය, කැටන්දොළ

වැඩබිම් විස්තරය

මෙම වැඩබිම සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තිරිවානාකැටිය ග්‍රාමනිලධාරි කොට්ඨාශය තුල පිහිටා ඇත. චලනය වන භූමි කොටස පිහිට ඇත්තේ කොළඹ - මඩකලපුව A4 මාර්ගයෙහි කැටන්දොල ප්‍රදේශයේ (රත්නපුර - පැල්මඩුල්ල කොටසේ) පිහිටි බෝක්කු අංක 105/3 සහ 105/4 අතරය.හානියට ලක්ව ඇති මන්දගාමීව චලනය වන බෑවුම් කොටස උතුරින් රත්නපුර - පැල්මඩුල්ල පාරට සහ දකුණින් ස්වාභාවික දිය පහරකින් මායිම් වෙයි.

i. ආසන්නම නගරය වන්නේ රත්නපුර නගරයයි. එය කිලෝ මීටර් 5 ක් පමණ දුරින් පිහිටා ඇත.
ii. අඩවියේ GPS සමුද්දේශය 6 .664184 N, 80 .436953 E වේ. පිහිටීම සිතියම සිතියම 1 හි දැක්වේ.
iii. ඉඩම් හිමිකම මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) සතුවන අතර අසංක චාමර ලියනගේ මහතාගේ පෞද්ගලික ඉඩමක් ද අයත් වේ.




*රූප සටහන 1: යෝජිත නායයාම් අවම කිරීමේ ස්ථානය සහ අවට පාරිසරික විශේෂාංග සහ සේවා යටිතල පහසුකම් පිළිබඳ ගූගල් පිළිබිඹුව. විස්තර සඳහා ඩ්‍රෝන්රූපය - ඇමිණුම I*

## 3. නායයෑම් උවදුර සිද්ධිය පිලිබඳ විස්තර

2016.05.26 දින, 300 mm කට අධික වර්ෂාපතනයක් නිසා බෑවුමේ චලනය ආරම්භ විය. මෙයට ප්‍රධානතම හේතුව වන්නේ මාර්ග ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිසා ඇතිවූ දුර්වල ජලාපවහන කළමනාකරණයයි. මෙහිදී මාර්ගයේ සහ මාර්ගයේ පිටාර ගැලීම සඳහා ප්‍රමාණවත් විධිවිධාන ලබා දී නොතිබීම ප්‍රධාන කොට සැලකිය හැක. මේ නිසා බෑවුම පාමුල දෙසට නිරන්තරයෙන් චලනය වීමට ඉඩ සකස්කරමින් පස හරහා අධික ලෙස ජල කාන්දුවීම සිදු වී ඇත. නායයාමේ බලපෑමට ලක් වූ මුළු ප්‍රදේශය වර්ග මීටර් 6700 ක් වේ.

නාය හිස කොළඹ - මඩකලපුව A4 මාර්ගයේ (රත්නපුර - පැල්මඩුල්ල කොටසේ) බෝක්කු අංක 105/3 අසල පිහිටා ඇත. මෙම චලනය නිසා මාර්ගයට සමාන්තරව දිගු පැල්මක් නිර්මාණය කරමින් මාර්ගයේ සහ බෑවුමේ අඩි 4ක පමණ කොටසක් ගිලා බැසීමට ලක්ව ඇත. මාර්ගයේ අස්ථායී කොටස වක්‍ර ස්වරූපයක් ගන්නා අතර මාර්ගයට සමාන්තරව බෑවුම පාමුලින් ගලා යන ඇල දක්වා දිව යයි. (*රූප සටහන* 3). සෙමින් චලනය වන බෑවුම නිසා අසල පිහිටා තිබෙන ගොඩනැඟිලි සහ ව්‍යුහවල විවිධාකාර මට්ටම් වල පැලීම් ඇති වී තිබේ.

**සිදුවීම නිසා ඇතිවූ අලාභහානි**

අලාභහානි වූ ගොඩනැගිලි අතරින් අසංක චාමර ලියනගේ මහතාගේ නිවස ප්‍රතිසංස්කරණය කිරීමට නොහැකි අයුරින් හානියට පත්ව ඇත. ඉහළ අවදානම් ලෙසින් හඳුනාගත් තවත් නිවාස 3ක් පවතින අතර ඒවායේ හිමිකරුවන් වනුයේ උම්මා සදීනා මිය, ML නාසීර් මයා සහ සෆ්වාන් මහතාය.

බෑවුමේ චලනය මන්දගාමී වීම නිසා මෙහිදී පුද්ගල අනතුරු කිසිවක් සිදුවී නොමැත. සිදුවීම අතරතුරදී හානියට පත් නිවෙස් වල පදිංචිකරුවන් වහාම ඉවත් කරන ලදී. සම්පූර්ණයෙන්ම හානියට පත් නිවසෙහි පදිංචිකරු සිල්ලර වෙළඳ සැලක් පවත්වාගෙන ගොස් ඇති අතර සිද්ධියෙන් පසු මෙම වෙළඳසල අත්හැර දමා තිබේ.

මෙම හේතුවෙන් මාර්ගයේ එක් කොටසකට හානි සිදුවීම නිසා එක මන් තීරුවක් වසා දැමීමට සිදුව ඇත. මෙම සිදුවීමෙන් මාර්ගයට හානි සිදු වූ හානිය නිසා රථ වාහන ගමනාගමනයට බාධා එල්ල වී ඇති අතර නිවාසවලට පිවිසීමේ පහසුකම්, ප්‍රජා සේවා (පාසල්, ප්‍රජා මධ්‍යස්ථානය, සෞඛ්‍ය සේවා, ආගමික ස්ථාන ආදිය) කරා එළඹීමට බාධා එල්ල වී තිබේ. සිද්ධිය නිසා බෝග / කෘෂිකාර්මික ඉඩම්වලට සැලකිය යුතු හානියක් සිදුවී නොමැත. *රූප සටහන 2: ව්‍යාපෘති ප්‍රදේශයේ ඡායාරූප බලන්න.*

| | |
|---|---|
|  |  |
| *රූප සටහන 2a: සෙමින් පහළට චලනය වන බෑවුම හේතුවෙන් හානියට පත් මාර්ගය* | *රූප සටහන 2b: දැනටමත් පහලට තල්ලු වූ කොටසේ ස්ථායිකරණ කටයුතු RDA මඟින් කෙරෙන අයුරු (09-08-02018)* |
|  |  |
| *රූප සටහන 2c: ඉහළ බෑවුම වෙත එන ජලය මඟින් පොදු නාන ස්ථානයක් නිර්මාණය කර ඇත (සාමාන්‍ය තත්වයන් යටතේ ඉහළ සෝදා යාමක් දැකිය හැක)* | *රූප සටහන 2d: අබලන් වූ මාර්ග කොටස සහ ගිලා බැස ඇති පහත බෑවුම් කොටස* |

*රූප සටහන 2: ව්‍යාපෘති ප්‍රදේශයෙහි පින්තූර*




*රූප සටහන 3: අවදානමට පත් බැවුමේ හා ගොඩනැගිලිවල භූගත චලනය පිළිබඳ රූපමය අර්ථ කථනය*

## 4. ඉදිරියටත් පවතින අවදානම අවම කිරීම සඳහා දැනට ගෙන ඇති පියවර

මෙම සිද්ධිය සම්බන්ධයෙන් NBRO කණ්ඩායම විසින් එම ස්ථානය නිරීක්ෂණය කර ඇති අතර, මතුපිට ජලය බෑවුම තුලට කාන්දු වීම වලක්වා අසල බෝක්කුව වෙත යොමු කිරීමට සහ මතුපිට ජලාපවහනය වැඩිදියුණු කිරීම සඳහා කඩිනම් උපදෙස් ලබා දී ඇත. අවදානම් කලාපය සහ අවදානමට ලක්ව ඇති නිවාස සීමාංකනය කිරීම සඳහා බිමෙහි ආතති පැළුම් ලකුණු කරන ලදී. ග්‍රාම නිලධාරිවරයා ඇතුළු නිවැසියන් අවදානම පිළිබඳව දැනුවත් කර ඇති අතර නිවාස වල ඉරිතැලීම් මිනුම් දර්ශක මගින් නිරීක්ෂණය කරන ලදී. මෙම ක්‍රියාමාර්ග ස්ථාවරත්වය සැලකියයුතු මට්ටමකට ඉහළ නැංවීමට සමත් වී ඇති නමුත් සම්පූර්ණයෙන්ම අවදානම පහකිරීමට ප්‍රමාණවත් නොවේ.

**නිවාස වලින් ඉවත් කිරීම:** හානියට පත් නිවාස හිමි අසංක චාමර ලියනගේ මහතා නිවසින් ඉවත් කර ඇත. 2017 සිට ඔහුට නිවසත් එහි පවත්වාගෙන ගිය වෙළඳ කටයුතුත් අහිමි වී තිබේ. තවත් නිවාස තුනක පවුල්වලට නිවාස වලින් ඉවත් වීමට දැනුම් දී තිබේ. ටයර් වෙළඳ සැලක් සහිත මින් එක් නිවාස හිමියෙකු තවමත් එය පවත්වාගෙන යයි. ඔවුන් සඳහා රුපියල් මිලියන 1.6 ක වටිනාකමකින් යුත් රජයේ නැවත පදිංචි කිරීමේ පැකේජයක් රජය විසින් ලබාදී ඇත. සෑම පවුලක්ම මෙම මුදල ඉඩමක් සහ නිවසක් මිලදී ගැනීම හෝ නිවසක් තැනීම සඳහා ප්‍රමාණවත් නොවන බව පෙන්වා දෙයි. බලපෑමට ලක් වූ පවුල් පිළිබඳ විමසා බැලීමෙන් පසු ගෙවන ලද වන්දි මුදලින් සේවා සඳහා පහසු ප්‍රවේශයන් සහිත ඉඩම් සහ නිවාස මිලදී ගත නොහැකි බව තහවුරු කර ඇත. එසේම, ඔවුන්ගේ මතය අනුව එම ස්ථානයට යාබදව පිහිටි ඔවුන්ගේ ජීවනෝපාය ආශ්‍රිත ක්‍රියාකාරකම් සියල්ල මෙමඟින් අහිමි වී යනු ඇත.

## 5. නායයෑමට ලක්වූ ප්‍රදේශය සහ අවට ඇති ප්‍රදේශ පිළිබඳ විස්තරය සහ වර්ථමාන අවදානම් තත්වය

නායයාමට ලක්වූ ප්‍රදේශය සහ ආසන්න ප්‍රදේශය මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගයට වෙන්කරන ලද රක්ෂිත භූමියට සහ පුද්ගලික ඉඩම් වලට අයත් වේ. මෙම අනතුර හේතුවෙන් අසංක චාමර ලියනේගේ, උම්මා සදීනා,

ML නසාර් සහ ෆස්වාන් යන අයගේ නිවාස අධික අවදානම් තත්වයක පවතී. (යොමුව. වාර්තා අංක NBRO/313500/06/RDO (L1)/17/074)

## 6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් මගින් බලපෑමට ලක්විය හැකි අවට පරිසරයේ සංවේදී අංග පිළිබඳ තොරතුරු

අධ්‍යයන ප්‍රදේශය තුළ කැලෑ ප්‍රදේශ, වනජීවී සංරක්ෂණ ප්‍රදේශ, පාරිසරික වශයෙන් සංවේදී වාසස්ථාන ආදී කිසිදු පාරිසරික වශයෙන් සැලකිය යුතු ස්ථානයක් නොමැත. භූගෝලීය පරිසර විද්‍යාව බොහෝ විට පහත්බිම් වැසි වනාන්තර වෘක්ෂලතා නියෝජනය කරයි. නමුත් ස්වභාවික පාරිසරය ගෙවතු වගා වලින් බලපෑමට ලක්ව ඇත. චලනය වන බෑවුම් ප්‍රදේශයේ පහල කොටස සමන්විත වන්නේ ඉහළ ශාක ඝනත්වයක් සහිත ගෘහ උද්‍යාන වලිනි. ඉහළ බෑවුම් ප්‍රදේශයේ නිවාස සහිත ගෙවතු පිහිටා ඇති අතර සහ නාය යන ප්‍රදේශයට ප්‍රතිවිරුද්ධ දිශාවෙන් පල්ලියක් පිහිටා ඇත. ස්වාභාවික දොළ පහරක් මාර්ගයට සමාන්තරව බෑවුමේ පහලින් ගමන් කරයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අවදානමකට ලක්වන අංග සහ සේවාවන් වනුයේ:

i. මාර්ගයේ ගමන් කරන රථ වාහන, මගීන් සහ පදිකයින්
ii. මාර්ගය අසල නිවාසවල වාසය කරන්නන්
iii. ඉදි කිරීම් ප්‍රදේශයේ අයිතිකරුවන්ගේ ඉඩම්
iv. ව්‍යාපෘතියෙන් බලපෑම් ඇතිවන ප්‍රදේශයේ වර්තමාන ආර්ථික කටයුතු
v. මුස්ලිම් පල්ලිය සහ එහි ආගමික කටයුතු
vi. පවුල් 30-50 කට පමණ ප්‍රජාවට ජලය සැපයෙන, බෑවුමේ හානියට පත් කොටස හරහා ගමන් කරන ජල සැපයුම් මාර්ග (තොරතුරු මූලාශ්‍රය: ප්‍රදේශයේ පදිංචිකරුවන්)
vii. කැටන්දොල දොළ පහර, එහි ජල ප්‍රවාහය සහ ගුණාත්මකභාවය

## 7. ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩ පිළිබඳ විස්තරය

යෝජිත නාය යාම් ස්ථායී කරන කාර්යයන් බොහෝමයක් ජලාපවහනය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කෙරෙනු ඇත. මෙයට පෘෂ්ඨීය කාණු පද්ධතියක් මගින් වැසි ජලය කළමනාකරණයට හා ආසන්නයේ පිහිටි බෝක්කුව වෙතට ජලය හැරවීමට අවශ්‍ය කරන ස්ථාවර ව්‍යුහ ඉදිකිරීම අන්තර්ගත වෙයි. භූගත කාණු පද්ධති වලට ජලාපවහන ලිං සමඟ යුගල කරන ලද තිරස් භූගත කාණුඉදිකිරීම තුලින් අස්ථායි ප්‍රදේශයේ භූගත ජල මට්ටම පහත හෙළීමත් මෙයට අන්තර්ගත වේ. තවද ගේබියන් ව්‍යුහ මගින් දුර්වල වී ඇති මාර්ගයේ කණ්ඩිය ශක්තිමත් කිරීමට සහ කණ්ඩියේ පතුල සවිමත් කිරීම යනාදිය මඟින් බෑවුම ශක්තිමත් කිරීමට ද බලාපොරොත්තු වේ.

## 8. අදාළ සමාජීය හා පාරිසරික බලපෑම් හා අවදානම් හඳුනා ගැනීම

### 8.1 ධනාත්මක බලපෑම

ස්ථායිකරණ කටයුතු මගින් දැනට පවතින අස්ථායි ඉඩම් සහ මාර්ග කොටස ස්ථාවර කෙරෙන අතර නිවෙස්, ව්‍යුහ සහ නිවැසියන්ගේ ආරක්ෂාව සහතික කෙරනු ඇත. මාර්ගය ස්ථාවර වන අතරම, දෙපසටම ධාවනය සඳහා මාර්ගය විවෘත වීම නිසා මාර්ග තදබදය අඩුවනු ඇත. මාර්ග වසා දැමීම හේතුවෙන් වැසි සහිත කාල පරිච්ඡේදය තුල ඇතිවන අවහිරතා මගහැරීමෙන් නගර අතර හොඳ සම්බන්ධතාවයක් ඇතිවේ.

### 8.2 ඍනාත්මක බලපෑම්

#### 8.2.1 ඉඩම් සහ අනාගත සංවර්ධන ක්‍රියාකාරකම් අහිමි වීම

නාය යාම් අවම කිරීමේ කටයුතු වලින් බොහොමයක් මාර්ගයට වෙන්කළ භූමි ප්‍රදේශයේ සහ අසංක චාමර මහතාගේ ඉඩම තුල සිදු කරනු ඇත. දැනට අසංක චාමර ලියනගේ මහතාගේ ඉඩම අත්හැර දමා ඇත. පවතින ආපදා තත්ත්ව නිසා අනාගතයේ දී ඉඩම දියුණු කිරීමට හෝ ගොඩනැගිලි ඉදිකිරීම නොකරන ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් දැනුවත් කර ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ඔහුගේ දේපලෙහි අනාගත සංවර්ධන අවස්ථාවන් අහිමි වනු ඇත. නායයාම නිසා භූමිය කිසිදු ඵලදායී කටයුත්තක් සඳහා දැනටමත් භාවිතයට නුසුළුවන් වී ඇති හෙයින් රුපියල් මිලියන 1.6 ක වන්දි මුදලක් ලබා දී ඇති මුත් ඔහු විසින් එය ප්‍රතික්ෂේප කරන ලදව ඇත. ව්‍යාපෘති භූමිය දැන් කිසිදු සංවර්ධනයක් සිදුනොකරන කලාපයක් ලෙස දැනටමත් සලකනු ලබන ඉඩමක් හෙයින් වන්දි ගෙවීම සඳහා ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන නොලැබේ. තවද ව්‍යාපෘතිය යටතේ ඉඩම් අත්පත් කර නොගනී.එම නිසා ඉඩම් හිමිකම පාඩු නොලැබෙන බව ප්‍රකාශ කිරීම සාධාරණ විය හැකිය. කෙසේ වෙතත්, ඉඩම් අයිතිකරුට ඉඩම් පරිහරණය සඳහා ඉඩ ලබා දේ. ඔහුට ඉඩම් වෙත ප්‍රවේශ විය හැකි නමුත් ඉඩමෙහි අනාගත සංවර්ධන ක්‍රියාකාරකම්වලට ඉඩ නොලැබේ.

ඉඩම එළිපහළි කිරීමේදී අසංක චාමර මහතාගේ හානියට පත් නිවස කඩා ඉවත් කළ හැකි ය. එහිදී නැවත ලබාගතහැකි වටිනා ගොඩනැඟිලි ද්‍රව්‍ය තිබිය හැකිය. මෙම ද්‍රව්‍ය සොයා ගැනීමෙන් තොරව විනාශ කිරීම සිදු වුවහොත් අයිතිකරුට ලබාගත හැකි වටිනා ගොඩනැඟිලි ද්‍රව්‍ය අහිමි වනු ඇත.

### 8.2.2 පාරිසරික, ජෛව විද්‍යාත්මක බලපෑම්, සත්ව හා ශාක විශේෂ

ව්‍යාපෘතිය මගින් භූ ගෝලීය පරිසර පද්ධති මත ඇති බලපෑම් ස්ථානීය වේ. සත්ව හා වෘක්ෂලතා සඳහා බලපෑම්, සංවේදී පරිසර පද්ධති විනාශ වීම, විශාල පරිමාණ වාසස්ථාන ඛණ්ඩනය වීම සිදු නොවන තරම් වේ. IUCN හි රතු දත්ත ලේඛනයේ අන්තර්ගත ගස් හෝ ලංකාවට ආවේණික හා තර්ජනයට ලක් වී ඇති ශාක වර්ග වැඩබිම හා අවට හඳුනාගෙන නොමැත. ආරක්ක්ෂා කලයුතු  ගස් ඉවත් කිරීමක් සිදුවීමට අවකාශ නොමැත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ගස් කැපීම / උදුරා දැමීම අවශ්‍ය වේ. එවැනි අවස්ථාවල දී අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය. සමහර ස්ථානවල ඉවුරුබඳ වෘක්ෂලතා තීරු ඉවත් කිරීම අවශ්‍ය විය හැකිය. සමහර ස්ථානවලදී වෘක්ෂලතාදිය සැලකියයුතු කොටස් වශයෙන් ඉවත් කරනු ලැබේ. මේ නිසා සමහර වාසස්ථාන ඛණ්ඩනය වීම සිදුවිය හැකිය. ප්‍රාදේශීය වශයෙන් සැලකිය යුතු බලපෑමක් සිදු විය හැක. ශාක විශේෂයන් පිළිබඳ අදාල දැනුම සහිත පාරිසරික හා ආරක්ෂක නිලධාරියකු විසින් නිසි අධීක්ෂණයක් සිදු නොකළහොත් නොදැනුවත්ව වටිනා දැව සහිත ශාක වර්ග කපා ඉවත් කර දැමිය හැකියි.

### 8.2.3 කලාපයේ ජලාපවහන රටාව මත ඇතිවන බලපෑම්

ජලාපවහන අපවිත්‍ර වීම සහ හැරවීම නිසා ඉදිකිරීම් කාලය තුළ ප්‍රදේශයේ පවතින මතුපිට හා උප පෘෂ්ඨ ජලාපවහන රටාව කඩා වැටීම බලාපොරොත්තු විය හැක. ඉදි කිරීම් අඩියර තුළ පවත්නා  ජල  මාර්ග ඇහිරීම හේතුවෙන් ජලය  එකතුවීම් හෝ ප්‍රාදේශීය වශයෙන් ගංවතුර ඇතිවීමේ අවදානම් තත්වයන්  බලාපොරොත්තු විය හැක. (තිරස් කාණු කැපුම් කාණු ඉදි කිරීම නිසා ඇතිවන අවහිර කිරීම් නිසා, පාංශු / ඉදිකිරීම් ද්‍රව්‍ය තොග රැස් කිරීම නිසා ආදී හේතුන් නිසාවෙන්.)

### 8.2.4 බාදන බලපෑම් සහ ජල ප්‍රවාහයන්හි පතුල වෙනස් වීම

මෙම ව්‍යාපෘතියේ ස්ථායිකරණ කටයුතු බොහෝ දුරට ජලාපවහන වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. එබැවින්, වැසි සමයේ දී අධික ජල පරිමාවක් ස්වභාවික දියපහරවල් කරා බෝක්කුවක් හරහා හෝ පඩි සහිත කාණු හරහා යොමුකරවීම අපේක්ෂා කෙරේ. මෙමඟින් දියපාරවල් වල ඉවුරු බාදනය, පතුල බාදනය සහ ගංගා ජල ප්‍රවාහය වැඩිවීම සිදුවිය හැක. එමනිසා පාරිසරික ගලායාම හා ජලජ පරිසර පද්ධති මත ඇතිවන බලපෑම ප්‍රාදේශීය වශයෙන් වැදගත් වේ.

### 8.2.5 ඉදිකිරීම් ක්‍රියාකාරකම් වලින් සිදු වන ජල දූෂණය

සුන්බුන් ඉවත්කිරීම, විදුම් ක්‍රියාවලි වලදී එකතුවන පස් ඉවත් කිරීම්, පස් කැනීම් හා බෑවුම්වල ප්‍රතිසංස්කරණය කිරීම ආදි ක්‍රියාවලින් වලදී පස් ඉවත් කිරීම නිසා සියුම් පාංශු අංශු සොදායාම්, පවත්නා ජලමාර්ග වල පාංශු තැන්පත්වීම් සහ ජලමාර්ග පහල රොන්මඩ එකතුවීම් බලාපොරොත්තු විය හැක. තෙල් හා අනෙකුත් හානිකර ද්‍රව්‍ය / යන්ත්‍රෝපකරණවලින් පිටවන දූෂක ද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැරකිරීම, තාවකාලික ගබඩා ටැංකිවලින් කාන්දු වීම, කම්කරුවන්ගේ ඝන අපද්‍රව්‍ය සහ අපජලය බැහැර කිරීම / අපද්‍රව්‍ය ඉවත් කිරීම නිසා ජල ප්‍රවාහ වලට අහිතකර බලපෑම් ඇතිවේ. මතුපිට ජල ප්‍රවාහයන් සමඟ සිමෙන්ති / වෙනත් අමුද්‍රව්‍ය ඇතුලු ඉදිකිරීම් ද්‍රව්‍ය මිශ්‍ර වීම මගින් ගලායන ජලයේ තාවකාලික දූෂිත තත්වයන් ඇතිවිය හැකි අතර පහල ප්‍රදේශ වල අනවශ්‍ය ද්‍රව්‍ය එක්රැස් වීමට හේතු වනු ඇත.

### 8.2.6 ඉදි කිරීම් අඩියර තුළදී මළ පහකිරීම් නිසා ජලය මඟින් වන ආසාදනය පැතිරීම

කොන්ත්‍රාත්කරුගේ කම්කරුවන්ගේ මල පහකිරීම් හේතුවෙන් පහල බෑවුම් ප්‍රදේශයේ ජල ප්‍රවාහ වල අසූචි මිශ්‍ර වීමේ හැකියාවක් බලාපොරොත්තු විය හැක

### 8.2.7 පහල ප්‍රදේශ වල ජලය භාවිතයට ඇතිවන බලපෑම

. ඉදිකිරීම් කටයුතු ආශ්‍රිත මුදාහැරීම් නිසා, ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම ද, රසායනික ඔක්සිජන් ඉල්ලුම ද, අවලම්භිත ඝන ද්‍රව්‍ය ප්‍රමාණය ද  තෙල් සහ ග්‍රීස් මට්ටම යනාදිය ඉහළ නැගීමෙන් දියපහර වල ජල දූෂණ මට්ටම තවදුරටත් වැඩි වනු ඇත.  අපද්‍රව්‍ය මඟින් ජලයේ ප්‍රශස්ථ තත්වයන් ඉක්මවා යා හැකි අතර පානීය ජලය, ස්නානය සහ ජලජීවී වගාව යනාදිය සඳහා ජලයේ පැවතිය යුතු අවම ප්‍රමිතීන් උල්ලංඝනය විය හැකිය. මේ නිසා  ජලය, මනුෂ්‍ය සහ ජලජ ජීවීන්ට නුසුදුසු තත්වයකට පත් වීමට ඉඩ ඇත. එබැවින් ඉදි කිරීම් අඩියර තුළදී අපවිත්‍ර ජලය හා පරිසර දූෂක කාරක බැහැර කිරීමේදී ඇතිවන බලපෑම ගැන සැලකිලිමත් වීම ඉතා වැදගත් වෙයි.

**8.2.8 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ඇතිවන ගැටළු**

ඉදිකිරීම් කාලය තුළදී ඝන අපද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීම මගින් ජලය හා පස දූෂණය විය හැකි අතර විවිධ පාරිසරික බලපෑම් ඇති විය හැක. ඉදිකිරීම් කාලය තුළ නිසි ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ යාන්ත්‍රණයක් භාවිතා නොකළ හොත් මෙමගින් ඇතිවන බලපෑම අධික වේ.

**8.2.9 වායු දූෂණය බලපෑම්**

වායු දූෂණයට දායක වන ඉදිකිරීම් ක්‍රියාකාරකම් වනුයේ: ඉඩම් පිරිසිදු කිරීම, ඩීසල් එන්ජින් මෙහෙයවීම, කඩා බිඳ දැමීම, පිළිස්සීම, ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම සහ ප්‍රවාහනය,ඉදිකිරීම් ද්‍රව්‍ය බැහැර කිරීම, ඉදිකිරීම් අපද්‍රව්‍ය හා විෂ සහිත ද්‍රව්‍ය (පිපිරුම් රසායන) සමග වැඩ කිරීම. තවද ඉදිකිරීම් කටයුතු අතරතුර කොන්ක්‍රීට්, සිමෙන්ති, ලී, ගල්, සහ සිලිකා භාවිතයේදී විශාල ලෙස සියුම් අංශු ඇතිවීම දැකිය හැක.

**8.2.10 ශබ්දය දූෂණය, කම්පන, පිපිරීම්, ඉදිකිරීම් කටයුතු අතරතුරදී ඇතිවන බලපෑම්, ගොඩනැගිලි වලට ඇති විය හැකි හානි, යටිතල පහසුකම්**

ඉදිකිරීම් උපකරණ වලින් ශබ්ද සහ කම්පන ඇතිවීම නොවැලක්විය හැක. වැඩබිමට සමීප ව, එනම් වැඩබිමේ සිට මීටර් 100 ක් ඇතුළත මිනිසුන් වාසය කරන ගොඩනැගිලි ඇති බැවින් ශබ්දය මගින් ඇති කරන බලපෑම අධික වේ;. එබැවින් මෙම ව්‍යාපෘතිය අසල්වැසි ප්‍රජාවට බලපෑම් ඇතිකරනු ඇත.

වැඩබිමට ආසන්නව පල්ලියක් ද පිහිටා ඇත. ආගමික ක්‍රියාකාරකම් වැඩිපුර සිදුවන සිකුරාදා දිනයන්හිදී බැතිමතුන් සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇත. කම්පන මගින් දැනටමත් පුපුරා ඇති ගොඩනැගිලිවල ස්ථායීතාවයට බලපෑම් ඇති විය හැකිය.

**8.2.11 වැඩබිමෙහි සේවකයන් සහ වැඩබිම ආසන්නයේ ජීවත්වන ජනතාව අතර ඇතිවන ආරවුල් හා සම්බන්ධතා**

ජනතාව ආසන්නයේ ජීවත් වන බැවින්, ඉදිකිරීම් ස්ථානයේ සේවකයින් හා ගම්වාසීන් සමග ආරවුලක් ඇති විය හැකිය.

**8.2.12** වැඩ බිම් වාඩි සහ ගබඩා ස්ථාන

කඳවුරු තුළ ඝණ අපද්‍රව්‍ය බැහැරකිරීම සහ සහ මලපවාහන ක්‍රමවත් නොවුනහොත් අසල්වැසි ජනතවට ගැටළු ඇතිවිය හැක. අසල්වැසියන්ට කරදර ඇතිවීමට පෙර ව්‍යාපෘතියෙන් පසු ශ්‍රම කඳවුරු නිසි පරිදි වසා දැමීම අවශ්‍ය වේ.

**8.2.13 ඉදි කිරීම් කටයුතු අතරතුරදී සාමාන්‍ය ජනතාව වැඩබිමට ඇතුළුවීමේ අවදානම**

**වැඩබිම තුල විදුම් යන්ත්‍ර සහ කැණීම් යන්ත්‍ර වැනි අධික අවදානමක් සහිත යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙම වටපිටාව පුහුණු ශ්‍රමිකයන්ට පමණක් වැඩ කිරීමට සුරක්ෂිතව වේ. අනවසර පුද්ගලයින්ට වැඩබිමට පිවිසේ නම්, බර යන්ත්‍රෝපකරණ මගින් හදිසි අනතුරුවලට ලක් වීමේ අවදානමක් ඇතිවේ.**

**8.2.14 පුපුරන ද්‍රව්‍ය සහ අනතුරුදායක ද්‍රව්‍ය**

මෙම ව්‍යාපෘතිය අතරතුර තද පාෂාණ පුපුරවා ඉවත් කිරීම අපේක්ෂා නොකෙරේ

8.2.15 **ඉදිකිරීම් කටයුතු වලින් මහජනතාවට ආරක්ෂාව: මගීන් සඳහා අවදානම**

ඉදිකිරීම් අදියර තුළදී නිතරම ගමන් කරන යන්ත්‍ර, ලෝඩර්, ට්‍රක් රථ ආදිය නිසා මාර්ගයට බාධා එල්ල වනු වනු ඇත. බොහෝ නාය අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග සීමිත ඉඩ ප්‍රමාණයක කඩා වැටුණු කණ්ඩි කොටසක සිදු කෙරෙන නිසා බර යන්ත්‍රසූත්‍ර, ට්‍රක් රථ සහ ලෝඩර ආදියෙන් මගීන්ගේ ගමනාගමනයට බාධා ඇති වීම ද ඔවුන්ගේ ජීවිතයට අවදානමක් එල්ල වීමටද ප්‍රවනතාවක් ඇත.

**8.2.16 ඉදිකිරීම් වලදී සේවකයන්ගේ ආරක්ෂාව**

**බර ඉදි කිරීමේ යන්ත්‍ර සීමිත අවකාශයකදී භාවිතා කිරීමට සිදුවන නිසා වාහන හා ඉදිකිරීම් යන්ත්‍ර සම්බන්ධ අනතුරු අවදානම ඉතා ඉහල වෙයි. ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන් විසින් අඩුවයස් කම්කරුවන් (ළමයින්) වැඩට යොදාගැනීම වැනි හේතු බරපතල අනතුරු හා තුවාල සිදුවීමේ අවධානම වැඩි කරයි.**

## 9. පවත්වනු ලැබූ හා / හෝ පවත්වනු ලැබීමට නියමිත මහජන හා පාර්ශ්වකරුවන්ගේ උපදේශන වැඩමුළු

අධි අවදානම් සහිත නිවාසවල පදිංචිව සිටි පහත සඳහන් අය ක්ෂේත්‍ර චාරිකාවලදී සලකා බැලිණි; අසංක චාමර ලියනගේ මහතා, උම්මා සදීනා මිය, ML. නසීර් මහතා. මෙම පුද්ගලයින්ට අනුව නැවත පදිංචි කිරීම හේතුවෙන් පීඩාවට පත් වූ ප්‍රජාවන්ට සහ පුද්ගලයන්ට දිගුකාලීන දුෂ්කරතාවයන් හා අසතුටුදායක ප්‍රතිඵල අත් වනු ඇත. මිලියන 1.6 හි පැකේජය ඉතා සුළු මුදලක් බව ඔවුන්ගේ මතය වේ. වෙනත් ස්ථානයකට පදිංචිය මාරු වීම ඔවුන්ගේ රැකියාවට, පාසැල් කටයුතු සහ අනෙකුත් ජීවනෝපාය ක්‍රියාකාරකම් කෙරෙහි බලපානු ඇත. එබැවින් ජනතාව තමන්ගේ අකමැත්ත පල කළහ. (යොමුව: ඇමුණුම I: වැඩබිම තත්වය දක්වන ඡායාරූප සහ උපදේශනය.)

### 9.1 උපදේශනයන සඳහා සහභාගී වූ පාර්ශ්වකරුවන්, උපදේශනයන්හි දී ලබාගත් නිර්දේශ හෝ ගිවිසුම් (ඇමුණුම II බලන්න)

## 10. වැදගත් පාරිසරික හා සමාජ ගැටළු

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ සහ කොන්ත්‍රාත්කරුගේ විශේෂ ක්‍රියාමාර්ග අවශ්‍ය වන සමාජ හෝ පාරිසරික බලපෑම් හෝ අවදානම්; ඇඟවුම් සහිත සැලකිය යුතු බලපෑම්

### 10.1 ජලය හෝ තෙත් බිම් කෙරෙහි ඇතිවන බලපෑම් (වැඩබිමෙන් පහල ප්‍රදේශයේ පිහිටා ඇති ජල මාර්ග, ගංගා හා අනෙකුත් ජල සම්පත් වෙනස් කිරීම හෝ දූෂණය කිරීම සම්බන්ධ ගැටළු). මෙහි නායයාම සහිත භූමියෙහි ඉදිකිරීම් / පිළිසකර කිරීම තුළින් ඇතිවන දිගුකාලීන බලපෑම් සහ අනාගත බලපෑම සහ අවදානම් ඇතුළත් වේ:

සුන්බුන් ඉවත්කිරීම, විදුම් ක්‍රියාවලි වලදී එකතුවන පස් ඉවත් කිරීම්, පස් කැනීම් හා බෑවුම්වල ප්‍රතිසංස්කරණය කිරීම ආදි ක්‍රියාවලි වලදී පස් ඉවත් කිරීම නිසා සියුම් පාංශු අංශු සොදයාම, පවත්නා ජලමාර්ග වල පාංශු තැන්පත්වීම් සහ පහල රොන්මඩ එකතුවීම් බලාපොරොත්තු විය හැක. තෙල් හා අනෙකුත් හානිකර ද්‍රව්‍ය / යන්ත්‍රෝපකරණවලින් පිටවන දූෂක ද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැරකිරීම, තාවකාලික ගබඩා ටැංකිවලින් කාන්දු වීම, කම්කරුවන්ගේ ඝන අපද්‍රව්‍ය සහ අපජලය බැහැර කිරීම / අපද්‍රව්‍ය ඉවත් කිරීම ආදිය නිසා ජල ප්‍රවාහ වලට අහිතකර බලපෑම් ඇතිවේ. මතුපිට ජල ප්‍රවාහයන් සමඟ සිමෙන්ති / වෙනත් අමුද්‍රව්‍ය ඇතුලු ඉදිකිරීම් ද්‍රව්‍ය මිශ්‍ර වීම මගින් ගලායන ජලයේ තාවකාලික දූෂිත තත්වයන් ඇතිවිය හැකි අතර පහල ප්‍රදේශ වල අනවශ්‍ය ද්‍රව්‍ය එක්රැස් වීමට හේතු වනු ඇත.

### 10.2 බාදන බලපෑම් සහ ඇල පතුල වෙනස් වීම

පාරිසරික ප්‍රවාහය, ඇළ ඉවුරු / පතුල සහ ජලජ පරිසර පද්ධති මත ඇතිවන බලපෑම ප්‍රාදේශීය වශයෙන් වැදගත් වේ.

### 10.3 ප්‍රවාහන යටිතල පහසුකම් සඳහා ඇතිවන බලපෑම් (විශේෂයෙන් තාවකාලික මාර්ග හා දුම්රිය මාර්ග අවහිර වීම්, රථවාහන තදබදය පිළිබඳ අවදානම)

පාර සම්පූර්ණයෙන් හෝ භාගිකව වසා දැමීම හේතුවෙන් සතියේ දිනවල, කාර්යාල වේලාවට, පාසල් කාලවලදී (උදෑසන, දිවා කාලය සහ සවස් කාලයේදී) වාහන ගමනාගමනයට බාධා එල්ල වේ. මෙය පදිකයින්ට සහ මගීන්ට හිරිහැරයක් වනු ඇත.

### 10.4 වැඩබිමෙන් පහල ප්‍රදේශයේ ඇති සේවා සඳහා වන බලපෑම් (ජල සැපයුම, අපවහන, විදුලිය ආදිය)

**ප්‍රජා ජල සැපයුම් නල ස්ථායිකරණයට ලක්වන බෑවුමේ හරහා යයි. ඉදි කිරීමේ කටයුතු සහ ගමන් කරන යන්ත්‍ර සූත්‍ර නිසා නිසැකවම මෙම නල වලට හානි ඇතිකරවනු ඇත. මෙම ජල නල මඟින් පවුල් 30-50 කට පමණ ජලය සපයයි.**

**10.5 වැඩබිමට යාබදව හෝ ආසන්නයේ (බෑවුම ඉහල, බෑවුම පහල, බවුමෙන් පහල ප්‍රදේශය ආදිය) ඇති ඉහල අවදානමක් සහිත හෝ මධ්‍ය පරිමාණ අවදානම් සහිත ප්‍රදේශ වල ජීවත් වන ගෘහ ඒකක**

ඉදිකිරීම් මගින් මහජන ආරක්ෂාවට දැඩි අවදානමක් ඇති කල හැක. ශබ්ද සහ කම්පන බලපෑම්, අධි අවදානම් ලෙස කලින් නම් කරන ලද නිවාස සහ ගොඩනැගිලිවල ඉරිතැලීම් මතුවීම් බලාපොරොත්තු විය හැක.

**10.6 ප්‍රදේශය තුළ ව්‍යාපාර, කෘෂිකාර්මික හෝ වෙනත් කටයුතු සඳහා භාවිතා කරනු ලබන ප්‍රදේශයන් පුනුරුත්තාපනය**

ව්‍යාපාර සඳහා භාවිතා කරන ප්‍රදේශ, විශේෂිත කෘෂිකාර්මික කටයුතුවලට හෝ වෙනත් කිසිවක් වැඩබිමට යාබදව නොමැති නිසා විශේෂිත බලපෑමක් නැත.

**10.7 වැඩබිමට ආසන්නයේ ඇති කෘෂිකාර්මික හෝ වෙනත් කටයුතු සඳහා භාවිතා කරනු ලබන ප්‍රදේශයන්**

මෙහි ඉදිකිරීම් කටයුතු දැනට පවතින ටයර් වෙළඳසැලේ ව්‍යාපාරික කටයුතු වලට බාධා ඇති කල හැක.

**10.8 ජනතාවට වැඩබිමට ඇතුළු වීමට හෝ හරහා ගමන් කිරීමට ඇති අවශ්‍යතාවන්**

පොදු ජනතාවට වැඩබිමට ඇතුළු වීමට විශේෂ අවශ්‍යතාවක් නොමැත. කෙසේ වෙතත්, අනවසර පිවිසුම් දැනුවත්ව හෝ නොදැනුවත්ව සිදුවිය හැකිය. එවිට ඔවුන් ක්‍රියාකාරී යන්ත්‍රෝපකරණ, වාහන, විදුලිය, හා පිපිරුම් ද්‍රව්‍ය මගින් අවදානමකට ලක්විය හැක.

10.9 **ප්‍රමුඛ සෞඛ්‍යආරක්ෂිත ගැටළු; කොන්ත්‍රාත්කරුවන් සඳහා වන සම්මත කොන්ත්‍රාත් අවශ්‍යතා වලින් ඔබ්බට යන විශේෂිත පියවර ගැනීමට සිදුවන අනන්‍ය සෞඛ්‍යාරක්ෂිත ගැටළු**

මෙම වැඩබිමට අදාළ සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටළු වෙනත් ඕනෑම නායයාම ස්ථායි කිරීමේ ස්ථානයකට පොදු ඒවා වේ. එවන් පොදු ගැටළු **ESMF** හිදී සාකච්ඡා කර ඇත. වැඩබිම තුල කම්කරුවන්ගේ ආරක්ෂිත අවශ්‍යතාවන් වඩාත් සවිස්තරව ලංසු ලේඛනයේ අංක **2003 5** හි දැක්වේ: ආරක්ෂිත උපකරණ සහ ඇඳුම් එහි අංක **2003** හි දැක්වේ.

**10.10 ළමා ශ්‍රමය යොදාගැනීම සහ බලහත්කාරීව ශ්‍රමය යොදාගැනීම**

ලංසු ලේඛනයේ ළමා ශ්‍රමය යොදාගැනීම හා බලහත්කාරයෙන් ශ්‍රමිකයන් යොදාගැනීම පිළිබඳව වැඩ කරන තත්ත්වයන් සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳව අංක **2003** වන කොටසේ උප කොටස් අංක **2003.3** හි දැක්වේ.

**11 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවසරය, විරුද්ධතාවක් නොමැතිබව, කැමැත්ත සහ අනුමැතිය**

**11.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

i. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් අනුමැතිය
   ව්‍යාපෘති කියාත්මක කිරීම සඳහා දිස්තික්කයේ මහඇමති හා පාර්ශ්වකරුවන් සම්බන්ධ වන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හමුවේ ව්‍යාපෘති සැලසුම ඉදිරිපත්කළ යුතු අතර දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් අනුමැතිය ලභා ගත යුතුය. PMU නිලධාරියා මෙම ව්‍යාපෘතිය ඉදිරිපත් කරනු ලබන අතර, ව්‍යාපෘති තොරතුරු සහ පාරිසරික හා සමාජයීය විවිධ ගැටලු මෙම රැස්වීමේදී ඉදිරිපත් කර මෙම ගැටළු සාකච්ඡා කර, යෝජිත නිර්දේශය ESMP ක්‍රියාත්මක කිරීම සඳහා සලකා බලනු ඇත
ii. සැලසුම් කමිටුවේ අනුමැතිය
   රත්නපුර නගර සභාවේ සැලසුම් කමිටුව විසින් මෙම ව්‍යාපෘතියට අනුමැතිය ලබා ගනු ඇත

**11.2 රජයේ ඉඩම් වල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කිරීම**

i. ව්‍යාපෘති ක්‍රියාවලි වලින් කොටසක් මාර්ගය සඳහා වෙන්කරන ලද ප්‍රදේශයේ සිදුකෙරන බැවින් අදාළ නියෝජිත ආයතනය වන්නේ මාර්ග සංවර්ධන අධිකාරියයි. ඉඩමට පිවිසීම, ඉදිකිරීම් කටයුතු කරගෙන යාම, ද්‍රව්‍ය ඉවත් කිරීම (ගස්, පස්, පාෂාණ හා විශාල ගල් කුට්ටි), ව්‍යුහයන් ඉදි කිරීම් සහ මෙහෙයුම් හා නඩත්තු කටයුතු දිගටම කරගෙන යාම ආදිය සඳහා අවශ්‍ය එකඟතාවයන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ මාර්ග සංවර්ධන අධිකාරිය අතර ඇති කරගනු ඇත..

ii. වැඩබිම් ක්‍රියාවලි සඳහා විදුලි බල සැපයුම ලබාගැනීමට සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයෙන් අනුමත කිරීම අවශ්‍ය වේ.

**11.3 පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අනුමත කිරීම**

i. ව්‍යාපෘතිය පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශයක පිහිටා ඇති බැවින් මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලය විසින් අනුමැතිය ලබා ගත යුතුය. ( ක්‍රියා පටිපාටිය සඳහා ඇමුණුම 11 බලන්න)

ii. එසේම, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වලදී සංරක්ෂිත ශාක විශේෂ ඉවත් කිරීමට සිදු විය හැකිය. මේ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ප්‍රාදේශීය ලේකම් හරහා අනුමැතිය ලබා ගත හැකිය (ක්‍රියා පටිපාටිය සඳහා ඇමුණුම 1V බලන්න).

**11.4 අනෙකුත් අනුමැතීන්**

i. පස්, පාෂාණ සහ ඛනිජමය අපද්‍රව්‍ය ප්‍රවාහනය හා බැහැර කිරීම සඳහා ප්‍රාදේශීය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අනුමැතිය ලබා ගත යුතුය.

ii. කැණීම් ද්කිරීම සඳහා අනුමැතිය - භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ අනුමැතිය (අවශ්‍ය වන්නේ නම් පමණි).

iii. අපද්‍රව්‍ය හා ශාකමය අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා රත්නපුර නගර සභාවේ අනුමැතිය ලබා ගත හැකිය

iv. ගල් පිපිරවීම අවශ්‍ය නම් ආරක්ෂක අමාත්‍යාංශයේ දිස්ත්‍රික් කාර්යාලයෙන් ප්‍රාදේශීය ලේකම් හරහා අනුමැතිය ලබා ගත හැකිය

**11.5 කැමැත්ත/ විරෝධයක් නොමැති බව පලකෙරෙන පුද්ගලික ඉඩම් හිමියන්ගේ නීත්‍යානුකුල එකඟතාවය**

i. ඉඩම් හිමිකරු වන අසංක චාමර මහතා සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය අතර නීත්‍යානුකූලව බැඳී ඇති ගිවිසුමක් අත්සන් කරනු ඇත. මෙහිදී ව්‍යුහයන් ඉවත් කිරීම, භූමියට පිවිසීම, ඉදිකිරීම් කටයුතු සහ දිගුකාලීන නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා කිසිදු විරෝධයක් නොදක්වන බවට එකඟ වෙයි.

ii. යෝජිත නාය යාම් ස්ථායිකරණ ප්‍රදේශය හරහා ජල සැපයුම් මාර්ග ඇති අතර ඉදි කිරීම් කටයුතු වලදී හානි ඇති විය හැක. මෙම තත්වය අවදානමට ලක්වූ පාර්ශව වෙත දැනුම් දෙනු ලැබේ. ව්‍යාපෘති පිරිවැය යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර ඒවා නැවත ස්ථාපිත කිරීමට කටයුතු කරනු ඇත. අනුමැතිය ලබා ගැනීම සඳහා නියමිත නියමිත කාල සටහන 1 වගුවේ දක්වා ඇත.

වගුව 1: අනුමැතිය සඳහා නියමිත කාල නියමය

| අනුමැතීන් | මාසය 1 | | | | මාසය 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ස1 | ස2 | ස3 | ස4 | ස1 | ස2 | ස3 | ස4 |
| ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම<br>***දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් අනුමැතිය***<br>*අයදුම්පත් ඉදිරිපත් කිරීම*<br>*ව්‍යාපෘති සාකච්ඡාව*<br>අදහස්වලට ප්‍රතිචාර දැක්වීම<br>**අනුමැතීන්** | | | | | | | | |
| ***සැලසුම් කමිටුවේ අනුමැතිය***<br>*අයදුම්පත් ඉදිරිපත් කිරීම*<br>*ව්‍යාපෘතිය දළ වශයෙන් පැහැදිලි කිරීම*<br>*අදහස්වලට ප්‍රතිචාර දැක්වීම*<br>***අනුමැතීන්*** | | | | | | | | |
| ***රාජ්‍ය ඉඩම් හිමියන්ගෙන් අවසර ලබා ගැනීම RDA & CEB***<br>***අයදුම්පත් ඉදිරිපත් කිරීම***<br>අදහස්වලට ප්‍රතිචාර දැක්වීම<br>**අනුමැතීන්** | | | | | | | | |
| ***DFC, DWLC වෙතින් අනුමත කිරීම***<br>***අයදුම්පත් ඉදිරිපත් කිරීම***<br>අදහස්වලට ප්‍රතිචාර දැක්වීම<br>**අනුමැතීන්** | | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **වෙනත් අනුමැතීන්**<br>භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය<br>ආරක්ෂක අමාත්‍යාංශය (අවශ්‍යතාවය අනුව) | | | | | | | | |
| පුද්ගලික ඉඩම් අයිතියෙන් කැමැත්ත / විරෝධතා නොමැති බව | | | | | | | | |

**12. පාරිසරික සමාජයීය කළමනාකරණ සැලසුම (ESMP)**

බලපෑම් හා අවදානම් කළමනාකරණය කිරීම සහ අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සහ විශේෂයෙන් අංශ 8 සහ 10 හි හඳුනාගත් බලපෑම් හා අවදානම් අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග. මෙය ESMP හි විශේෂිත නිර්දේශ හා අවශ්‍යතාවන්ගේ අන්තර්ගත වෙයි.

**12.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම**

ව්‍යාපෘති පාදක කරගත් නැවත පදිංචි කිරීමක් නොමැති බැවින් මෙම වැඩබිම සඳහා අදාළ නොවේ. කෙසේ වෙතත්, ඉවත් වීමට උපදෙස් දුන් නමුත් අවදානම් කලාපයේ රැඳී සිටින පවුල් කීපයක් සිටී. මෙම නිවාසවලට බර යන්ත්‍රෝපකරණ මගින් ඇතිවන භූ කම්පනය හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාවලි අතරතුර ව්‍යුහාත්මක හානි ඇති විය හැකිය. (ව්‍යාපෘතිය හේතුවෙන් සිදුවන හානියක දී වන්දි සැලසීමට යෝජනා ක්‍රමයක් සැකසිය යුතුය. 2002.2. 17.2- බලන්න; ESMP සඳහා කොන්තාත්කරුගේ යටිතල පහසුකම් සහ මාර්ග පහසුකම්)

**12.2 මිනිසුන් ඉවත් කිරීම: වැඩබිමෙන් හෝ වැඩබිමට ආසන්නව පිහිටා ඇති ප්‍රදේශයෙන්, බෑවුම ඉහල/පහල අධි අවදානම් කලාපයෙන් හෝ වැඩබිමට පහල ප්‍රදේශ වලින් ජනතාව ඉක්මනින් ඉවත් කිරීමට සකස් කර ඇති ක්‍රමවේදය**

මෙම අවදානම මෙම වැඩබිමේ දී ඇතිනොවේ

**12.3 හානි වූ ව්‍යුහයන්, පහසුකම් හා යටිතල පහසුකම් ඉවත් කිරීම සඳහා ක්‍රියා පටිපාටිය**

හැකිනම් අසංක චාමර මහතාගේ නිවස මැදිහත් වීම වැළැක්වීම සඳහා ව්‍යාපෘති සැලසුම් කිරීමේදී සැලකිල්ලට ගත යුතුය. අයිතිකරුගේ පූර්ණ අනුමැතියකින් තොරව හානි වුවද ඉදිකළ නිවස ඉවත් නොකළ යුතුය. ඉඩම් හිමිකරු මේ සඳහා එකඟ කරවා ගැනීමට විශේෂ උපදෙස් ලබා ගත යුතුය. අනාගතයේ වටිනාකමක් නොමැති බැවින් ව්‍යාපෘතියේ පිරිවැය මගින් නිවාස ඉවත් කිරීමට ඔහු සලකා බැලිය හැකිය. එහෙත්, ඉඩම් අයිතිකරු වන අසංක චාමර මහතා සහ නීති සම්පාදනය කිරීමේ අධිකාරිය අතර නීත්‍යානුකූලව බැඳී ඇති ගිවිසුමක් අත්සන් කිරීම මගින් නිවාස ඉවත් කිරීමට කිසිදු විරෝධයක් නොමැති බව ප්‍රකාශ කිරීම අනිවාර්ය වේ. මෙම ක්‍රියාවලිය තුළ අවම වශයෙන් පහත සඳහන් පියවර අඩංගු විය යුතුය.

i. ඉඩම් හිමිකරුගේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් විමසීම
ii. ඉඩම් හිමියාට නිවාස වෙතින් ඕනෑම වටිනා භාණ්ඩයක් තමන් විසින් හෝ තමන් වෙනුවට කොන්ත්‍රාත්කරු විසින් ලබාගැනීමට ඉඩසැලසීම
iii. ව්‍යාපෘතිය මගින් නිවාසය ඉවත් කිරීමේ පිරිවැය දැරීම
iv. ජල සැපයුම් වලට හානි සිදුවුයේ නම් විකල්ප ජල සැපයුමක් හෝ අලාභයක් සඳහා වන්දි ලබා දීම කලයුතුය.

**12.4 ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් දේපල / භාවිතයන් අහිමි වීම සඳහා වන්දි ඉල්ලා සිටීමට අවශ්‍යතාවන්**

අවදානම් සහිත නිවාසවල ව්‍යාපෘතිය හේතුවෙන් ඉරි තැලීම් ඇති වුවහොත් එය වෙනුවෙන් වන්දි ලබා දේ. තාක්ෂණික තක්සේරු වාර්තාවක් මත පදනම්ව බලපෑමට ලක්වූ පාර්ශවයන්ට වන්දි ගෙවීමට විධිමත් සැලසුමක් මෙම ව්‍යාපෘතියට තිබිය යුතුය.

**12.5 පහත දැක්වෙන අංශ සඳහා මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබා දීම අවශ්‍ය කෙරේ.**

i. නායයෑම් මගින් ඇතිවන අවදානම සහ අවම කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවට ජනයා දැනුවත් කිරීම හා දැනුවත් කිරීම සඳහා වැඩසටහන්.

ii. ඉදිකිරීම් අදියර තුළ ඇති විය හැකි අවදානම් තත්වයන් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමෙහි අවශ්‍යතාවය; කෙටිකාලීන පූර්ව අනතුරු ඇඟවීම් (ඉවත් කිරීම්) සහ ඉදිකිරීම හා ඉඩම් පරිහරණය සම්බන්ධ විධි විධාන.

## 12.6 සැලසුම් පාදක පාරිසරික / සමාජ කළමනාකරණ සලකා බැලීම්

පහත දැක්වෙන පාරිසරික සහ සමාජීය සැලසුම් කරුණු ඒවායේ පාරිසරික හා සමාජයීය වැදගත්කම මත පදනම්ව නිර්දේශ කරනු ලැබේ.

වගුව 2: සැලසුම් අදියරෙදී සලකා බැලෙන පාරිසරික හා සමාජීය කරුණු

| **සැලසුම් විශේෂාංගය** | **මෙම වැඩබිම සඳහා අදාළ වන නිර්දේශිත මට්ටම** |
| --- | --- |
| **i. ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ සම්පත් සුරක්ෂිත කෙරෙන සැලසුම්**<br>මහා පරිමාණයේ ගස්වැල් ශුද්ධ කිරීම් රහිත වන පරිදි සහ ඉවත් කිරීමට සිදුවන ශාක විශේෂ ගණන අවම වන පරිදි නිර්මාණය සැලසුම් කළ යුතුවේ.වැදගත් ශාක විශේෂ සොයාගත හැකි නම් ඒවා සංරක්ෂණයට ප්රමාණවත් අවධානයක් යොමු කළ යුතුය | ඉහළ |
| **ii. සත්ව ජනාවාස සම්බන්ධතා සහ මංපෙත්**<br>පාරිසරක වශයෙන් සංවේදී වාසභූමි වල ඇති ශාක විශාල ප්‍රමාණයක් ව්‍යුහ ඉදිකිරීමට හෝ ප්‍රවේශය සඳහා හෙළිපෙහෙළි කිරීමට අවශ්‍ය වන්නේ නම් හෝ ගැඹුරු කාණු ආදිය තැනීමට සිදු වේ නම්, ඉන් ඇති වන බලපෑම ස්ථානීය වුවත් නිර්මාණයට වාසභූමි, මංකඩ සහ ශාක තීරු ආදිය සම්බන්ධ කිරීමේ ක්‍රමවේද ඇතුළත් වියයුතු වේ | පහල |
| **iii. ජල මූලාශ්‍ර සංරක්ෂණය**<br>නාය අවදානම් අවම කිරීමේ කටයුතු වලට පෘෂ්ඨීය සහ භූගත ජලය ඉවත් කිරීම ඇතුළත් වේ. ඉවත් කරනු ලබන ජලය සාපේක්ෂ වශයෙන් හොඳ තත්වයක පවතී. නිසියාකාරව සැලසුම් කරන ලද නිර්මාණයකදී මෙම පිටතට ගන්නා ජලය වන සතුන්ට පමණක් නොව අවට ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ ස්නානීය ජල අවශ්යතා සහ ගෙදරදොර වැඩ කටයුතු සඳහාත් , ඇතැම්විට පානිය අවශ්‍යතා සඳහා පවාත් භාවිතා කළ හැකි වන පරිදි පරිවහනය කළ හැකි වනු ඇත. | පහල |
| **iv. ජල සැපයුම සඳහා වන බාධා**<br>ස්ථායි කෙරෙන බෑවුමේ ඇති ජලය තනි පුද්ගල හෝ ප්‍රජා ජල සැපයුමක් සඳහා මූලාශ්‍රයක් ලෙස යොදාගෙන ඇත්නම්, ස්ථායිකරණ ක්‍රියාවලියේදී වතුර මට්ටම පහත්වීම හේතුවෙන් ජල ප්‍රභවයට බලපෑම් ඇතිවීමට ඇති ඉඩකඩ වැඩිය. එවැනි අවස්ථාවන්හිදී ප්‍රජාව සඳහා විකල්ප ජල ප්‍රභවයක් (තාවකාලික / හෝ ස්ථිර) සැලසුම තුළ ඇතුළත් විය යුතුය. | පහල |
| **v. සෞන්දර්යාත්මකව අනුරූපී සැලසුම් සලකා බැලීම්**<br>සෞන්දර්යාත්මක සංවේදී පරිසරවල නිර්මාණයන්, දෘෂ්ය දූෂණය අවම කිරීම සඳහා ස්වභාවික පරිසරය සමග සංකලනය වන ව්‍යුහයන් සැලකිල්ලට ගත යුතුය. සුදුසු ස්ථායිකරණ ව්‍යුහයන් නිර්මාණය කිරීම සඳහා භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පියාකුගේ සේවය වැදගත් විය හැකිය. | පහල |
| **vi. හරිත පාරිසරික ලක්ෂණ සලකා බැලීම**<br>බොහෝ ස්ථායිකරණ කටයුතු සිදුකෙරෙන්නේ පාරිසරික වශයෙන් සංවේදී ස්ථානවල බැවින්, සැලසුම් කිරීමේදී පරිසර හිතකාමී නිර්මාණයන් සලකා බැලීමට නිර්දේශ කරයි. උදාහරණ ලෙස: පාංශු ඛාදනය පාලනය සඳහා දේශීය වෘක්ෂලතා විශේෂ භාවිතා කිරීම, පරිසරයේ විවිධත්වය පවත්වා ගැනීමට ශාක සංයෝජන භාවිතා කිරීම, ආක්‍රමණික ශාක විශේෂයන් ඇතුළත් කිරීම වැළැක්වීම, ඉදිකිරීම් සඳහා කැණීම් ද්‍රව්‍ය භාවිතය දැක්විය හැක.. | මද්‍යස්ථයි |
| **vii. සේවකයින් / මගීන් සහ ප්‍රජා ආරක්ෂාව**<br>ඉදිකිරීම් අදියර තුළදී නාය යාම සක්‍රිය වීමක් සිදු විය හැකි අතර කම්කරුවන්ට සහ මගීන්ට තර්ජනයක් විය හැකිය. එබැවින් බර්ම්ස්, ආරක්ෂිත දැල් වැනි සැලසුම් මත පදනම් වූ ආරක්ෂිත ක්‍රම සැලකිල්ලට ගත යුතුය (ස්ථිර / තාවකාලික) | මද්‍යස්ථයි |

| | |
|---|---|
| **viii. බාදනය පාලනය කිරීමේ ව්‍යුහයන්**<br>ජල අපවහන කළමනාකරණයේ දී ජලය පමණක් වෙන් කර බෝකුවක් හරහා අසල දියපරකට එකතු කිරීම කරනු ලබයි. වැසි කාලවලදී මෙම කාණු වල ජලපහර සැලකිය යුතු ලෙස ඉහළ යා හැකි අතර මෙමගින් ඇළ පතුල සහ ඉවුරු බාදනයට විය හැක. එබැවින් ජල ධාරාවන් ස්වභාවික දිය පහරට පිවිසීමේ වේගය අවම කිරීම සඳහා ප්‍රවාහ වේගය මන්දනය කරන ව්‍යුහ ප්‍රමාණවත් ලෙස සැලකිය යුතුය. ස්ථායිකරණ වැඩබිම ආසන්නයේ ඇල මාර්ග සහ බෝක්කු තිබේ නම් සැලැස්මෙහි මේවා ඇතුළත් විය යුතුය. **ඉහල ජලජ විවිධත්වයක් සහිත ස්වාභාවික ජල ධාරාවක් නායගිය බෑවුමේ පාමුල ප්‍රදේශය ආසන්නයෙන් ගලා යයි.** | ඉතා ඉහළ |
| **ix. ඉදිකිරීමෙන් පසු නඩත්තු හා මෙහෙයුම් අවම සැළසුම්**<br>මෙහිදී ජලාපවහන කළමණාකරණය සඳහා ගුරුත්ව කාණු වැනි නිෂ්ක්‍රීය ශිල්ප ක්‍රම සලකා බැලිය යුතුය. කාණු අවහිර වීම වළක්වා ගැනීම සඳහා නිවැරදි පයිප්ප විෂ්කම්භයන්, සිදුරු විෂ්කම්භයන් සහ බෑවුම නිවැරදිව සලකා බැලිය යුතුය. ස්වාභාවික ඇලදොළ වලට ජලය බැස්වීමට අපේක්ෂා කරන්නේ නම්, නඩත්තුව අවම ව්‍යුහ සහ බාදනයට ඔරොත්තු දෙන මෙන්ම රොන්මඩ ඉවත් කෙරෙන සැලසුම් අන්තර්ගත කළ යුතුය. ව්‍යුහයන් සඳහා කල්පවතින ද්‍රව්‍ය භාවිතා කළ යුතු අතර ප්‍රදේශයේ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව ගැන සලකා තෝරා ගත යුතුය. වානේ භාවිතා කරනු ලබන්නේ නම් දිරායාම වලකාලන ක්‍රම සලකබැලිය යුතු අතර ජියෝ ටෙක්ස්ටයිල් ආදිය භාවිතා කරන්නේ නම් රොන්මඩ මගින් භූගත කාණු අවහිර නොවන පරිදි ඊට ගැලපෙන පරිදි සැලසුම් සකස් කළ යුතුය. | ඉතා ඉහළ |

## 12.7 ඉදිකිරීම් අදියර තුළදී වන බලපෑම් අවම කිරීම

### 12.7.1 ඉදිකිරීම් අදියර තුළ පාරිසරික හා සමාජ කළමනාකරණ අවශ්‍යතාවන්ට අනුකූල වීම සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සුදුසුකම්

පාරිසරික සහ සමාජීය බලපෑම් අවම කිරීම හා කළමනාකරණය කිරීම සඳහා ගැනෙන ක්‍රියාමාර්ග සාමාන්‍යයෙන් සියලු නායයාම අවම කිරීමේ වැඩබිම් සඳහා පොදු වේ. මෙම බලපෑම් බොහෝ දුරට ඉදිකිරීමේ ක්‍රියාවලින්ට සම්බන්ධ ඒවා වේ. එබැවින් එම බලපෑම අවම කිරීම ඉදිකිරීම් කොන්ත්රාත්කරුගේ යුතුකමකි. ඉදිකිරීම් කොත්රාත් කරුගේ ලංසු ලේඛනයේ ඇතුළත් කිරීම සඳහා **"ඉදිකිරීම් කටයුතු අතරතුරදී පාරිසරික, සමාජයීය හා සෞඛ්‍ය සහ ආරක්ෂණ (ES & HS) කළමණාකරණ සඳහා කොන්ත්‍රත්කරුගේ සුදුසුකම්"** පිළිබඳව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් විස්තරසහිත ලේඛනයක් සකසා ඇත. මෙම වැඩබිම සඳහා අදාළ වන ප්‍රමාණය දක්වමින් ප්‍රධාන අංශ පහත වගුවේ සාරාංශ කර ඇත. (වගුව 3). විස්තර සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා වන ESMP පරිශීලනය කරන්න.

කොන්තාත්කරු විසින් ඉදිරිපත් කරන ලංසුවේ ESMP වැඩ පිළිෙවළ කියාත්මක කිරීන පිළිවෙල අන්තර්ගත කල යුතු වන අතර ඒ සඳහා ඔහුෙග් නිපුණතාවයන් පිළිබඳ සාධක ඉදිරිපත් කළ යුතුය. ESMP සඳහා වන පිරිවැය වෙනම ගෙවීම් අයිතමයක් ලෙස දැක්විය යුතුය. තෝරාගත් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික සහ සමාජයීය කළමනාකරණ වැඩපිළිවෙල විස්තරයක් ඉදිරිපත් කළ යුතු අතර PMU ඒකකය විසින් එය අනුමත කිරීමට නියමිතය.

වගුව 3: සමාජයීය හා සෞඛ්‍ය සහ ආරක්ෂණ වැඩපිළිවල සඳහා කොන්ත්‍රත්කරුගේ සුදුසුකම්

| **පාරිසරික සමාජයීය කලමනාකරණ සැලසුමට අනුකූල වීමට ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු සතු වගකීම නම් ලේඛනයට අනුව යොමු අංකය** | **අයිතමය** | **ව්‍යාපෘතියට අදාලත්වය** |
|---|---|---|
| **2002 පාරිසරික හා සමාජ අධීක්ෂණය** | | |
| 2002.2 1) | වැඩබිම තුල ගබඩා කිරීම් | ඉතා අදාළයි |
| 2002.2 2) | ශබ්ද සහ කම්පන | ඉතා අදාළයි (ශබ්ද සහ කම්පන) |
| 2002.2 3) | ගොඩනැගිලි වලට සිදුවන අලාභානි සහ පැලුම් | ඉතා අදාළයි |
| 2002.2 4) | අපද්‍රව්‍ය බැහැරලීම් | ඉතා අදාළ (ආසන්නයේ ඇති ජලමාර්ගය) |
| 2002.2 5) | ප්‍රතික්ෂේප වන ද්‍රව්‍ය බැහැරලීම් | ඉතා අදාළ (ජල මාර්ග/ මාර්ගයට |

| | | |
|---|---|---|
| | | වෙන්කල ප්‍රදේශය) |
| 2002.2 6) | දූහුවිලි පාලනය | ඉතා අදාළ (වාහන, පදිකයින්, නිවාස) |
| 2002.2 7) | ඉදිකිරීම් ද්‍රව්‍ය හා අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම | අදාළයි |
| 2002.2 8) | ජලය | ඉතා අදාළ (ආසන්නයේ ඇති ජලමාර්ගය) |
| 2002.2 9) | ශාක හා සත්ව විශේෂ | අදාළයි |
| 2002.2 10) | භෞතික හා සංස්කෘතික සම්පත් | ඉතා අදාළ (පල්ලිය) |
| 2002.2 11) | පාංශු ඛාදනය | ඉතා අදාළයි |
| 2002.2 12) | පාංශු දූෂණය | අදාළයි |
| 2002.2 13) | පස් කැපීම | අදාළයි |
| 2002.2 14) | ගල් කැඩීම | අදාළ නොවේ |
| 2002.2 15) | වාහන හා යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම | අදාළයි |
| 2002.2 16) | මහජනතාවට බාධා කිරීම | ඉතා අදාළයි (අසල්වාසීන්) |
| 2002.2 17) | උපයෝගිතා සේවා සහ මාර්ගය දෙපස පහසුකම් | ඉතා අදාළයි (මාර්ග,නිවාස,ජල සැපයුම්) |
| 2002.2 18) | අලංකාරය වැඩි දියුණු කිරීම | අදාළයි (සෞන්දර්යාත්මක වශයෙන් සංවේදී මාර්ග කොටස) |
| **2002-5. පාරිසරිකමය අධීක්ෂණ කටයුතු** | මූලික සමීක්ෂණ (වාතය, ජලය, ශබ්දය, කම්පන, පැලුම් සමීක්ෂණ) | ස්ථානීය නිරීක්ෂණ සැලසුම බලන්න |
| | ඉදිකිරීම් අවධිය තුල සමීක්ෂණ(වායු, ජල, ශබ්ද, කම්පන, පැලුම් සමීක්ෂණ) | ස්ථානීය නිරීක්ෂණ සැලසුම බලන්න |
| | මෙහෙයුම් අවධිය තුළ සමීක්ෂණ | විකල්පයි |
| | වාර්තා කිරීම හා වාර්තා පවත්වාගෙන යාම | අදාළයි |
| **2003. වැඩ කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව** | | |
| 2003.2 | ආරක්ෂා පහසුකම් සංවිධානය සහ සන්නිවේදනය | අදාළයි ( අනාරක්ෂිත බැවුම්/ නිවාස/ පදිකයන්/ බර වාහන) |
| 2003.3 | ළමා මෙහෙවර සහ බලාත් ශ්‍රමය | අදාළයි |
| 2003.4 | ආරක්ෂක වාර්තා සහ අනතුරු පිළිබඳ දැනුම් දීම | ඉතා වැදගත් |
| 2003.5 | ආරක්ෂක උපකරණ සහ ඇඳුම් පැළඳුම් | ඉතා වැදගත් |
| 2003.6 | ආරක්ෂණ නිරීක්ෂණයන් | ඉතා වැදගත් |
| 2003.7 | ප්‍රථමාධාර පහසුකම් | ඉතා වැදගත් |
| 2003.8 | සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ තොරතුරු සහ පුහුණුව | ඉතා වැදගත් |
| 2003.9 | බලාගාර, උපකරණ සහ සුදුසුකම්ලත් පුද්ගලයින් | ඉතා වැදගත් |

***වැදගත්:*** *මෙම වැඩබිමට වෙනත් ඕනෑම වැඩ බිමකට අදාළ පොදු ESPM හි අඩංගු කරුණු අදාල වේ.*
***අතිශයින්ම වැදගත්:*** *වැඩබිමට අදාල ESPM හි අඩංගු කරුණු පාරිසරික ක්‍රමවේදයන් සැකසීමේදී භාවිතා කිරීමට කොන්ත්‍රාත්කරු විසින් විශේෂ අවධානය යොමු කළ යුතුය.*
***සමහර විට අදාල වියහැක:*** *ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වැඩබිම අදාල ලෙස හඳුනාගත හොත් මෙම ESMP ක්‍රියාත්මක කරනු ලැබේ*
***අදාළ නොවේ:*** *අනාවරණය වූ කොන්දේසි යටතේ මෙම කොටස මෙම වැඩබිම සඳහා අදාළ විය නොහැක*
***විකල්ප:*** *අවශ්‍ය වුව හොත් පමණක් ක්‍රියාත්මක කල යුතු වේ.*
***වැඩබිම් විශේෂිත නිරීක්ෂණ සැලසුම බලන්න:*** *කොන්ත්‍රාත්කරු ESPM ට අදාල පොදු නිරීක්ෂණ දර්ශක අවශ්‍යතාවන්ට අමතරව වැඩබිම් විශේෂිත නිරීක්ෂණ සැලැස්මෙහි සඳහන් පරිදි අධීක්ෂණය කටයුතු කිරීම සඳහා බැඳී සිටී.*
***යොමු කිරීම:*** *කොන්තාත්කරුවන් ESMP ක්‍රියාත්මක කිරීම සඳහා වන අවනතභාවය*

### 12.7.2 වැඩබිමට විශේෂිත අවධානම් අවම කිරීම

පහත දැක්වෙන්නේ ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩබිමට විශේෂිත අවධානම් අවම කිරීමේ පියවර වේ.

වගුව 4: ස්ථානීය පාරිසරික සමාජයීය සහ සෞඛ්‍යාරක්ෂක අවම කිරීමේ පියවර

| අවමකිරීමේ අංගය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අදියර | වගකීම |
|---|---|---|

| | | |
|---|---|---|
| **i. ප්‍රජා ජල සැපයුම්**<br>**ස්ථායිකරණ කටයුතු කෙරෙන බැවුම් කොටස හරහා යන ප්‍රජා ජල සැපයුම් මාර්ග වැඩබිම් සුදානම් කිරීමේදී නිසි පරිදි ස්ථාපනය කල යුතු අතර ඉදිකිරීම් අවදියේදී කිසිම හානියක් සිදු නොවිය යුතුය. යම් හානියක් සිදු වුවහොත් වහාම නිවැරදි කිරීම් සඳහා විධිවිධාන සකස් කළ යුතුය** | වැඩබිම සුදානම් කිරීම සහ ඉදිකිරීම් කටයුතු | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **ii. ප්‍රජා සේදීම් සහ ස්නානය කිරීමේ ස්ථානය**<br>**මෙම ස්ථානයට යාබද ප්‍රජා ජල සැපයුම් මධ්‍යස්ථානය ප්‍රජාව විසින් නිසි අවසරයක් නොමැතිව කම්කරුවන්ගේ ස්නානය කිරීම් හා සනීපාරක්ෂක කටයුතු සඳහා භාවිතා නොකළ යුතු අතර කොන්ත්‍රාත්කරු කිසිම තත්වයක් යටතේ ඉදිකිරීම් කටයුතු සඳහා මෙම ජලය භාවිතා නොකළ යුතුය** | ඉදිකිරීම් | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **ii. මුස්ලිම් පල්ලියේ යාච්ඤා වේලාව**<br>**පල්ලියේ විශේෂ ආගමික ක්‍රියාකාරකම් සිදුකෙරෙන අවස්ථා වලදී හා සිකුරාදා හා දිනවල යාච්ඤා කටයුතු වලට කිසිදු බලපෑමක් ඇති නොවීමට අවධානයෙන් සිටිය යුතුය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික හා සමාජ ඒකකය මෙම තත්ත්වය ඇගයීමට ලක් කළ යුතු අතර ඇති විය හැකි ආරවුල් අවම කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සකස් කළ යුතුය.** | ඉදිකිරීම් | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **v. ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම**<br>**කිසිම අවස්ථාවක ඉදිකිරීම අපද්‍රව්‍ය ස්වාභාවික ජල මාර්ගයට එක් කල නොහැක. කොන්ත්‍රාත්කරු විසින් අනුමත ස්ථානවල ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා රත්නපුර නගර සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.** | ඉදිකිරීම් | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **v. ඉදි කිරීම් අවධිය තුළ බාදනයෙන් වන බලපෑම අවම කිරීම**<br>වැසි කාලවලදී වැඩබිම තුල හෙළි පෙහෙළි කිරීම්, බෑවුම වෙනස් කිරීම, පස් ඉවත් කිරීම ආදිය අවම කිරීම නිර්දේශ කරනු ලැබේ. | ඉදිකිරීම් | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **vi. දූවිලි පාලක පෙරන භාවිතය**<br>අධික දූවිලි හෝ වායු උත්පාදන ක්‍රියාකාරකම් ඇති වුවහොත් විශේෂ පෙරන භාවිතා කළ යුතුය | ඉදිකිරීම් | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| vii. **ඉදිකිරීම් සඳහා ජලය**<br>ඉදිකිරීම් සඳහා ජලය ලබා ගත යුත්තේ අනුමත ස්ථාන වලින් පමණි | ඉදිකිරීම් | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **viii. වැඩබිමට යාබදව හෝ ආසන්නයේ ඇති අධි අවදානම් සහ මධ්‍ය අවදානම් සහිත ප්‍රදේශ වල ජීවත් වන නිවෙස් (කණ්ඩියට ඉහතින්, කණ්ඩියට පහතින්, දොළ පහරේ පහලට වන්නට යනාදී වශයෙන්)**<br>ජාතික දූෂණ පාලන රෙගුලාසිවලට අනුකූලව, ඉදිකිරීම් අවධියේදී අධික ඝෝෂාව, කම්පන සහ වායු දූෂණය පාලනය කළ යුතු ය.<br>යන්ත්‍ර සූත්‍ර වැඩ වේලාවෙන් පරිබාහිරව ක්‍රියාත්මක කිරීම වැළැක්විය යුතුය. නොවැලක්විය අවස්ථා වලදී බර යන්ත්‍රෝපකරණ ක්‍රියා කිරීමේදී ඇති විය හැකි ආරවුල් වලක්වා ගැනීමට නිවැසියන් හමුවී+ අර්ථාන්විත උපදෙස් ලබාදීම් කල යුතුය | ඉදිකිරීම් | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **ix. විවෘත ස්ථාන වල මලපහ කිරීම හා කුණු දැමීම**<br>ඇතිවිය හැකි ජල / පස දූෂණය පිළිබඳ ගැටළු පහත ක්‍රම මගින් අවම කරගත හැක.<br>I. ජලය දූෂණය හා ජලය හරහා අතුවන ආසාදන,විවෘත බැහැර කිරීම හේතුවෙන් පහල ජාල ප්‍රදේශ වල ජල භාවිතයට ඇතිවන බලපෑම් පිළිබඳ දැනුවත් කිරීම<br>II. වැඩබිම ආසන්නයේ කම්කරුවන්ට වැසිකිළි පහසුකම් සැපයීම<br>III. සේවකයන්ගේ සනීපාරක්ෂක ක්‍රියාකාරකම් ගැන සුපරීක්ෂාකාරීත්වය සහ අධීක්ෂණය කිරීම<br>IV. කොන්දේසියක් උල්ලංඝනය කරන සේවකයන්ට දඬුවම් කිරීම. සේවකයින්ට වැඩබිම තුළ සනීපාරක්ෂක පහසුකම් සැපයිය යුතු අතර, සනීපාරක්ෂක අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කළ යුතුය. | වැඩබිම සුදානම් කිරීම සහ ඉදිකිරීම් කටයුතු | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **x. වැදගත් ගමනාගමන යටිතල පහසුකම් කෙරෙහි බලපෑම (විශේෂයෙන්ම තාවකාලිකව මාර්ග හෝ දුම්රිය මාර්ග වෙත පිවිසිය නොහැකි වීම, මාර්ග තදබදය ඇති වීමේ අවදානම)**<br>වැඩබිමට විශේෂිත වූ ESMP ට අනුකූලව විධිමත් වාහන පාලනයක් තිබිය | ඉදිකිරීම් | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| යුතුය. වැඩබිමට යාබද මාර්ගයේ වංගුවක් ඇති බැවින් විධිමත් මාර්ග ආරක්ෂණ වැඩපිළිවෙලක් තිබිය යුතුය. මාර්ග අනතුරු ඇඟවීමේ සංඥා/පුවරු සහ පුහුණුව ලත් ස්ථිර මුරකරුවන් මේ සඳහා ඇතුළත් විය යුතුය. | | |
| **xi.** වැඩ වෙලාව<br>ඉදිකිරීම් කටයුතු දිවා කාලයට පමණක් සීමා විය යුතුය. ආරක්ෂිත ගැටළු හා ශබ්දය හා කම්පනය හේතුවෙන් වනජීවීන් හට සිදුවන හානිය අවම කිරීම සඳහා කිසිම හේතුවක් මත ප.ව. 6 න් පසු වැඩ කිරීම අනුමත නොකෙරේ. | ඉදිකිරීම් | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xii.** **වැඩබිමට ඇතුළු වීමට හෝ හරහා සාමාන්‍ය ජනතාවට ඇති අවශ්‍යතාව**<br>කොන්ත්‍රාත්කරුගේ පූර්ණ කාලීන මුරකරුවන් විසින්, දැනුවත් කිරීම් මඟින් හා අවවාදාත්මක පුවරු මගින් වැඩබිමට අනවසර පිවිසුම් මඟහරවා ගත යුතුය. | | |
| **xiii. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නිවැසියන් අධි අවදානම් කලාපයේ බවට හඳුනාගෙන ඇත**<br>**වැසි දිනවලදී ජා.ගො.ප.ස. අනතුරු ඇඟවීම් පිළිබඳව දැනුම් දිය යුතුය. අනතුරු ඇඟවීම් සඳහා ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම සඳහා දැනට ක්‍රියාත්මක වන අනතුරු ඇඟවීම් බෙදාහැරීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කළ යුතුය. PMU හි පාරිසරික හා සමාජ ඒකකය විසින් ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට පියවර ගත යුතුය.** | ඉදිකිරීම් | E&SU of PMU |
| **xiv. ව්‍යුහයන් ඉවත් කිරීම**<br>**වැඩබිමෙහි ක්‍රියාකාරකම් සඳහා ඉඩම් හිමියන්ගෙන් අනුමැතිය අවශ්‍ය වේ.** | වැඩබිම සූදානම් කිරීම | E&SU of PMU |

### 12.7.3 වැඩබිමට අදාල නිරීක්ෂණ අවශ්‍යතාවන්

ඉදිකිරීම් අදියර තුළ මෙම වැඩබිමට පහත දක්වා ඇති අධීක්ෂණ සැලසුම ක්‍රියාත්මක කිරීම දැඩි ලෙස අවධාරණය කරනුලැබේ. මීට අමතරව ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් ESMP හි සඳහන් කළ අධීක්ෂණ ක්‍රියා පටිපාටිය ද ක්‍රියාත්මක කළ යුතුය.

වගුව 5: පාරිසරික හා සමාජ අධීක්ෂණ සැලසුම; ඉදිකිරීම් අදියර

| **අධීක්ෂණ අවශ්‍යතාවය** | **පරාමිතීන්** | **වාර ගණන** |
|---|---|---|
| i. මූලික නිරීක්ෂණ | ජලයේ ගුණාත්මකභාවය<br>වැඩ ආරම්භයට පෙර අධි අවදානම් නිවෙස් වල පැලුම් පරික්ෂාව<br>භූමි කම්පන<br>පසුබිම් ශබ්දය මැනීම<br>වාතයේ ගුණාත්මක බව: අංශු | එක් වරක් * |
| ii. ඉදිකිරීම් කටයුතු අතරතුර | ජලයේ ගුණාත්මකභාවය | බැවුම කැපීම සිදු කරන කාලය අතරතුර, පොලව විදීම් සිදුවන අතරතුර (සෑම මසකම) * |
| | අධි අවදානම් නිවෙස් වල පැලුම් පරික්ෂාව | ඉදිකිරීම් කටයුතු අතරතුර සැලකිය යුතු චලනයක් වාර්තා වුවහොත් ** |
| | භූමි කම්පන | විදුම් යන්ත්‍ර ක්‍රියාත්මක වන කාලය තුල හෝ වෙනත් භූ කම්පන ඇතිවන ක්‍රියාකාරකම් අතරතුරදී * |
| | ඉදිකිරීම් නිසා ඇතිවන ඝෝෂාව | අධික ශබ්ද ජනනය වන කාල තුළ * |
| | වාතයේ ගුණාත්මක බව: අංශු | මසකට වරක් * |
| iii. වාහන වලින් සිදුවන විමෝචන | අදාළ සියලු යන්ත්‍රෝපකරණ / වාහන සඳහා අදාල වන පරිදි විමෝචන පාලන පරීක්ෂණ සහතිකය තිබිය යුතුය - උපදේශකවරයාගේ වැඩබිම් බාර පාරිසරික හා සමාජයීය නිලධාරියා විසින් පරීක්ෂා කළ යුතුය | |
| iv. අධීක්ෂණ ආයතනය | * පැලුම් සමීක්ෂණ හැර සෙසු පරාමිතීන් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි වී ඇති සුදුසු ස්වාධීන නිරීක්ෂණ ආයතනයක්<br>** PMU ට පිළිගත හැකි ආයතනයක් මගින් පැලුම් සමීක්ෂණ පැවැත්විය යුතුය | |

| | |
|---|---|
| v. වාර්තා කිරීම් අවශ්‍යතා | *ජලයේ ගුණාත්මකභාවය– මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද පවතින පරිසර ජල තත්ත්ව ප්‍රමිතීන් සමග සැසඳීම*, 2017<br>***වැඩ ආරම්භයට පෙර අධි අවදානම් නිවෙස් වල පැලුම් පරික්ෂාව*** *- වෘත්තීය වාර්තාවක් විය යුතුය*<br>***භූමි කම්පන*** *- යන්ත්‍රසූත්‍ර, ඉදිකිරීමේ කටයුතු සහ රථවාහන ගමනාගමනය සඳහා වන අන්තර් ප්‍රමිතීන්, මධ්‍යම පරිසර අධිකාරිය*<br>***පසුබිම් ශබ්දය මැනීම*** *– අති විශේෂ ගැසට් පත්‍ර අංක*.924.1, *මැයි* 23,1996, CEA<br>***අංශුමය ද්‍රව්‍ය හා සම්බන්ධ වායු තත්ත්ව*** *- 2008 අගෝස්තු 15 අංක 1562/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ පනවන ලද ජාතික සංසරණ වායුගෝලීය ගුණාත්මක ප්‍රමිතීන් - ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරිය.* |

## 13. වැඩබිම සඳහා දුක් ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පරිසර හා සමාජ නිලධාරියා මේ සඳහා වගකිය යුතු වේ. **මෙහිදී පහත පුද්ගලයින් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කල යුතුය**; a) අසංක වාමර මහතා (ඉඩම් හිමිකරු) b) ප්‍රාදේශීය RDA - රත්නපුර කාර්යාලය, c) අධි අවදානමක් සහිත ප්‍රදේශයේ නිවාස අයිතිකරුවන්. d) මුස්ලිම් පල්ලියේ ප්‍රධාන පූජක තුමා. ***(යොමුව: දුක් ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය සඳහා නිර්දේශිත ක්‍රියාපටිපාටිය බැලීමට පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුව)***

## 14. තොරතුරු අනාවරණය කිරීම

පහත දැක්වෙන වගුවේ දක්වා ඇති ආකාරයට පහත සඳහන් ආකෘති වලට පහත දැක්වෙන ආයතන හා සංවිධාන වෙත ES තොරතුරු අනාවරණය කිරීම PMU හි වගකීම වේ.

වගුව 6: තොරතුරු අනාවරණය කිරීමේ යෝජනා ක්‍රමය

| තොරතුර | යෝජිත ආයතන | තොරතුරු අනාවරණය කිරීමේ පිළිවෙල |
|---|---|---|
| i. ව්‍යාපෘති සැලසුම (වැඩබිම් තොරතුරු, සැලසුම, ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන) | දිස්ත්‍රික් CEA, DFC, DWLC, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, RDA, රජයේ ඉඩම් හිමියන්, වෙනත් දිස්ත්‍රික් මට්ටමේ නියෝජිතායතන, NBRO දිස්ත්‍රික් කාර්යාලය, AIIB | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, අනුමැතීන් සහ කැමැත්ත සඳහා අත්සන් කිරීම සඳහා අදාල වාර්තාව ඉදිරිපත් කිරීම, අනුමත කිරීම් හා කැමැත්ත පල කිරීම් |
| ii. පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම | දිස්ත්‍රික් CEA, DFC, DWLC, AIIB, | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, අනුමැතීන් සහ කැමැත්ත සඳහා අත්සන් කිරීම සඳහා අදාල වාර්තාව ඉදිරිපත් කිරීම, අනුමත කිරීම් හා කැමැත්ත පල කිරීම් |
| iii. අධීක්ෂණ වාර්තා (මූලික හා ඉදිකිරීම් අදියර තුළ) | දිස්ත්‍රික් CEA, DFC, DWLC, AIIB සහ අදාළ පාර්ශ්වයන්, සුදුසු පරිදි | ප්‍රගති රැස්වීම්, විශේෂ රැස්වීම්, අදාළ වාර්තා ඉදිරිපත් කිරීම |
| iv. පාරිසරික යෝග්‍යතාව, සේවකයින්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සඳහා වැඩබිම පරීක්ෂා කිරීම | දිස්ත්‍රික් CEA, DFC, DWLC, RDA, ප්‍රාදේශීය ලේකම්, පොලිසිය, රජයේ ඉඩම් හිමියන්, ග්‍රාමනිලධාරී, දිස්ත්‍රික් කාර්යාලය NBRO, AIIB සහ අදාළ පාර්ශ්වයන්, සුදුසු පරිදි | ලිඛිත හා වාචික සන්නිවේදනය, අදාළ වාර්තා ඉදිරිපත් කිරීම |
| v. ES කරුණු සම්බන්ධව ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී ගන්නා ලද තීරණ | දිස්ත්‍රික් CEA, DFC, DWLC, RDA, ප්‍රාදේශීය ලේකම්, පොලිසිය, රජයේ ඉඩම් හිමියන්, ග්‍රාමනිලධාරී, දිස්ත්‍රික් කාර්යාලය NBRO, AIIB සහ අදාළ පාර්ශ්වයන්, සුදුසු පරිදි | ලිඛිත හා වාචික සන්නිවේදනය, අදාළ වාර්තා ඉදිරිපත් කිරීම |
| vi. දුක් ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය | අදාළ පාර්ශ්වයන්, AIIB | ලිඛිත හා වාචික සන්නිවේදනය, අදාළ වාර්තා ඉදිරිපත් කිරීම |

වගුව 7: උපදේශන ආයතන හරහා රැස් කරන ලද තොරතුරු මට්ටම

| දිනය | ආයතනය | තොරතුරු ලබාගැනීම සඳහා සම්බන්ධ කරගත් අය |
|---|---|---|
| 08/08/ 2018 පැය 10.30ට | මාර්ග සංවර්ධන අධිකාරිය | WPGL වෙරජීව මහතා – විධායක ඉංජිනේරු |
| 08/08/2018 පැය 13.00ට | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | නිමල් S දේවගේ මහතා –<br>වන ජීවී නිලධාරී |
| 09/08/2018 පැය 10.00ට | මධ්‍යම පරිසර අධිකාරිය | K G.D.N කිරිඇල්ල මහතා<br>අධ්‍යක්ෂක - CEA රත්නපුර දිස්ත්‍රික්කය |
| 09/08/2018 පැය 13.00ට | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWLC) | මංජුල විද්‍යාරත්න මහතා / වනජීවී නිලධාරී<br>රත්නපුර |
| 09/08/2018 පැය 14.00ට | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | දුල්මිණි පටබැඳි ආරච්චි මෙනවිය<br>කාර්යාල සහායක |

ඇමිණුම **I:** ව්‍යාපෘති ප්‍රදේශයේ ඩ්‍රෝන දර්ශණයක්




*කඩ ඉරෙන් තාවකාලික අවදානම් ප්‍රදේශය පෙන්නුම් කරයි*

**ඇමිණුම II: වැඩබිමේ තත්ත්වය හා උපදේශනය**

| | |
|---|---|
|  |  |
| *රූපසටහන a: A.M. සෆ්රාස් මහතා ; නායයෑම් ස්ථායිකරණ කටයුතු පිළිබඳ කාර්ය මණ්ඩලය විසින් අල් මස්ජිදුර් රාහ්මනියි මුස්ලිම් පල්ලියේ ආගමික නියෝජිතයා දැනුවත් කරන ලදී.. (09-08-2018)* | *රූපසටහන b: ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කාර්ය මණ්ඩලය විසින් නායයෑම ස්ථායිකරණ කටයුතු පිළිබඳ අසංක චාමර මහතා  දැනුවත් කරන ලදී (09-08-2018)* |
|  |  |
| *රූපසටහන c: අසන්ක චාමර මහතාගේ සම්පූර්ණයෙන්ම විනාශ වූ නිවස සහ මාර්ගයේ ආතති පැල්ම* | *රූපසටහන d: අසන්ක චාමර මහතාගේ සම්පූර්ණයෙන්ම විනාශ වූ නිවස* |
|  |  |
| *රූපසටහන e: අස්ථායි කොටස හරහා ගමන් කරන ජලනල* | *රූපසටහන  f: බෑවුමේ චලනය හේතුවෙන් ගිලා බැසීමට ලක්වූ ප්‍රදේශයේ හානි වූ මාර්ග කොටස* |

**ඇමිණුම III: පාර්ශ්වකරුවන්ගේ උපදේශනය පිළිබඳ වාර්තාව: රත්නපුර දිස්ත්‍රික්කය**

| දිනය: 08/08/2018 සහ 09/08/2018 | | |
|---|---|---|
| **ආයතනය** | **සම්බන්ධීකරණ නිලධාරීගේ නම සහ තනතුර** | **සලකා බැලුණු කරුණු** |
| මාර්ග සංවර්ධන අධිකාරිය | WPGL වෙරජීව මහතා – විධායක ඉංජිනේරු | ✓ මෙම ප්‍රදේශය රත්නපුර-අවිස්සාවේල්ල ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරි කාර්යාලයට අයත් වේ<br>✓ මාර්ග සංවර්ධන අධිකාරියට මේ සම්බන්ධව කිසිදු විරෝධයක් නොමැති අතර, ව්‍යාපෘතියේ අවශ්‍යතාව පේනවා දෙයි.<br>✓ වෙනත් සැලකිල්ලට ගත් කරුණු<br>• ව්‍යාපෘතිය නිමි වීමෙන් පසු නිසි පරිදි භාර දීම අවශ්‍ය වේ<br>• මාර්ග සංවර්ධන අධිකාරිය අවධානම අවම කිරීමෙන් පසු නඩත්තු කටයුතු කරනු ඇත<br>• ඉදිකිරීම් වලදී කොන්ත්‍රාත්කරු පුද්ගලික ආරක්ෂණ උපකරණ භාවිතා කළ යුතු බව අවධාරණය කරයි<br>• සෑම අවස්ථාවකදීම කොන්ත්‍රාත්කරු වාහන, පදිකයින් සහ රථවාහන ආරක්ෂණ ක්‍රියාමාර්ග, බාධක, ධජ සහ රෑ වැඩ සඳහා විදුලි ආලෝක සම්බන්ධ ආරක්ෂක විධි විධාන ගත යුතුය.<br>• ඉදිකිරීම් / කැණීම් කල ද්‍රව්‍ය මගී ජනතාව සඳහා අපහසුතාවයක් නොවිය යුතුය |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | නිමල් S දේවගේ මහතා – වන සංරක්ෂණ නිලධාරී | ✓ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ව්‍යාපෘතියට විරෝධයක් නැත.<br>පහත සඳහන් කරුණු අවධාරණය කෙරිණි..<br>✓ රත්නපුර දිස්ත්‍රික්කය තුළ වන රක්ෂිත වෙන්කර ඇත. කෙසේ වෙතත්, ඇතැම් විශාල ඉඩම් කොටස් සඳහා තවමත් පැහැදිලි මායිම් නොමැතිව පවතින අතර, ඒවායින් බොහොමයක් LRC හි බලයට යටත් වේ. දැනට වනාන්තර භූමි මැනුම් කටයුතු සිදුකරමින් පවතී.<br>✓ කෙසේ වෙතත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට, පුද්ගලික අයිතිකරුවන්ට හෝ LRC ට අයත් සියලු ඉඩම් සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය අවශ්‍ය වේ<br>✓ පෞද්ගලික / එල්.ආර්.සී / වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් වල මායිම් පැහැදිලි නොමැතිනම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත යුතුය.<br>✓ වන සංරක්ෂණ දෙපර්තමේන්තුවෙහි භූමිකාව වන්නේ හෙළිපෙහෙළි කිරීමට නියමිත භූමි කොටස පරීක්ෂා කර ඉවත් කිරීමට අවශ්‍ය ගස් වල වටප්‍රමාණය මැනීම හා ඉවත් කරන ප්‍රදේශයට වැදගත් විශේෂිත වාසභූමි ගණනය කිරීමයි. මෙසේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් බිම් කොටස සමීක්ෂණය කර දැව සංස්ථාවට වාර්තාවක් භාර දෙනු ඇත. කොන්ත්‍රාත්කරුට ගස් කැපිය හැකි නමුත් ඉවත් කිරීම දැව සංස්ථාව විසින් සිදුකෙරෙනු ඇත. සෙන්ටිමීටර් 18 ට වැඩි වටප්‍රමාණයක් සහිත සියලුම ශාක දැව සංස්ථාවට ගනු ලැබේ.<br>✓ ව්‍යාපෘති සැලැස්මේ කටුපිටපත වන සංරක්ෂක නිලධාරීයාට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අනුමැතිය ලබා ගතයුතු බව ඔහු ප්‍රකාශ කළේය.<br>✓ මෙය වනාන්තර භූමි පෙදෙස් වලට පමණක් නොව වනාන්තරයක් ආසන්නයේ තිබෙන ඕනෑම ඒකලිත ප්‍රදේශයකට ද පොදු වේ.<br>✓ රත්නපුර බොහෝ වනාන්තර භූමි ප්‍රදේශ පවතින නිසා, පහත අයුරේ අවශ්‍යතා සඳහා සේවා සහ අදාළ අනුමැති ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේදී අවශ්‍ය කෙරේ. |

| | | |
|---|---|---|
| | | • රක්ෂිත වනාන්තර වලට ඇතුල් වීම, ශාක වර්ග ඉවත් කිරීම, ව්‍යාපෘති වැඩ සඳහා දැව හෝ වෙනයම් දේ ලබාගැනීම කල නොහැක<br>• පිපුරුම් රසායන යොදා ගල් පිපිරවීම් ක්‍රියාවලියේදී සතුන්ට හානි නොවිය යුතුය<br>• ව්‍යුහාත්මක ස්ථායි කිරීමේ ක්‍රමවේදයන් පරිසර හිතකාමී මෙන්ම සෞන්දර්යාත්මකව සැලසුම් වලට අනුගත විය යුතුය.<br>• පිළිසකර කිරීම සඳහා පැළ යොදා ගැනේ නම් පෙර අනුමැතිය ලබාගත යුතුය<br>• පූර්ව දැනුවත් කිරීම තුලින් වන සංරක්ෂණ දේපාර්තෙමේන්තුව මගින් වගා කිරීම සඳහා ගුණාත්මකව ගස් ලබා දීම මගින් ව්‍යාපෘතියට සහාය දිය හැකිය.<br>• නැවත වගාව සඳහා සුදුසු ශාක වර්ග නිර්දේශ කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගත යුතුය.<br>✓ (LRC) යේ හෝ පුද්ගලික ඉඩම්වල ඉඩම්වල 1ha ට වඩා වැඩි වනාන්තර එළිකිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සෘජුව මැදිහත් වනු ඇත.<br>✓ (LRC) යේ හෝ පුද්ගලික ඉඩම්වල ඉඩම්වල 1ha වඩා අඩු වනාන්තර එළිකිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මැදිහත් වනු ඇත.<br>✓ ජලජ හා භූගත වාස භූමි මැනුම් නිර්දේශ කළ හැකි සමහර ස්ථාන සඳහා පාදක අධ්‍යයනයන් ඉල්ලා සිටිනු ඇත. ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම තුලදී සමාන වාර්තා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඉල්ලා සිටිනු ඇත. |
| මධ්‍යම පරිසර අධිකාරිය | K G.D.N කිරිඇල්ල<br>මහතා<br>අද්‍යක්ෂක - CEA<br>රත්නපුර දිස්ත්‍රික්කය | ✓ ජාතික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානයේ 1996 අංක 772/22 දරන පාංශු සංරක්ෂණ පනත යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රදේශය හැර ඉතිරි ප්‍රදේශ සංවේදී ප්‍රදේශය ලෙස ගැසට් කර ඇත.<br>✓ මෙම ගැසට් පත්‍රය යටතේ ව්‍යාපෘතියේ විශාලත්වය නොතකා ඕනෑම සංවර්ධන කටයුත්තක් අනුමත කර නොමැත.<br>✓ ව්‍යසනයකදී මෙය අවශ්‍ය නොවේ.<br>✓ ව්‍යාපෘතිය සඳහා පිරවීමට මූලික තොරතුරු ප්‍රශ්නාවලිය (BIQ) අවශ්‍ය වේ<br>✓ දියපහර බෑවුමෙන් පහල පිහිටීම නිසා පරිසර ප්‍රවාහය පවත්වා ගැනීමට අවශ්‍ය වේ<br>✓ ආවේණික ශාක විශේෂ, විශේෂ වාසස්ථාන පැවතිය හැකි බැවින් සත්ව හා ශාක අධ්‍යයනය අවශ්‍ය වේ<br>✓ මෙම පාරිසරික ඇගයීම ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසුව වෙනස සසඳා බැලීමට අවශ්‍ය විය හැකිය<br>✓ මධ්‍යම පරිසර අධිකාරිය නිර්දේශ සහිතව අනුමැතිය ලබා දෙනු ඇත. |
| 09/08/2018 | | |
| ආයතනය | **සම්බන්ධීකරණ නිලධාරීගේ නම සහ තනතුර** | **සලකා බලනු ලැබූ කරුණු** |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWLC) | මංජුල විද්‍යාරත්න<br>මහතා / වනජීවී<br>නිලධාරී<br>රත්නපුර | ✓ ව්‍යාපෘතියට විරෝධයක් නොමැත<br>✓ අනුමැතිය සඳහා DWLC වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය<br>✓ වනජීවී ආඥාපනත යටතේ වන සත්ත්ව හා ශාක ඉවත් කිරීම අවශ්‍ය විය.<br>✓ ශාක හා සත්ත්වයන් ඉවත් කිරීම; ආවේණික, තර්ජනයට ලක්වූ, රතු ලැයිස්තු යටතේ නම් DWLC වෙතින් අනුමැතිය අවශ්‍ය විය. |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | දුල්මිණී පටබැඳි<br>ආරච්චි මෙනවිය | ✓ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව නම් ඉඩම් කොමසාරිස් ජනරාල් - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් |

| | | |
|---|---|---|
| | කාර්යාල සහයිකා | ලිපියක් මගින් අනුමැතිය ලබා ගත යුතුය |

**ඇමිණුම IV: රජයේ ඉඩම් හිමියන්ගෙන් සහ පාරිසරික ආයතනවලින් අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත ක්‍රමවේදය**

**1. මාර්ග සංවර්ධන අධිකාරියට වෙන් කරන ලද ප්‍රදේශයන්හි නායයෑම් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා වූ ක්‍රියා පටිපාටිය**

i. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සැලසුම පිළිගත යුතුවේ: ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් අවශ්‍ය වන අනුමැතීන් පිළිබඳ විධිමත් ඉල්ලීමක් සමග RDA වෙත සවිස්තරාත්මක සැලසුම් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ඉහත ලිපි ලේඛන සකස් කළ යුතු අතර ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරි කාර්යාලයට ලේඛන ඉදිරිපත් කළ යුතුය.

ii. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය මෙම යෝජනාව ඇගයීමට ලක් කරනු ලබන අතර ව්‍යාපෘතිය පිළිබඳ කෙටි හැඳින්වීමක් ඉල්ලා සිටිය හැක. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් එම අවශ්‍ය විස්තර සැපයිය යුතුය.

iii. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අනුමත කිරීමෙන් පසු, වැඩබිමට පිවිසීමට, ඉදිකිරීම් ව්‍යුහයන් සහ නාය යාම් ස්ථායිකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය අතර ගිවිසුමක් අත්සන් කරනු ඇත.

iv. ඇතුළත් විය හැකි කොන්දේසි

- ස්ථායිකරණ කටයුතු නිමකිරීමෙන් පසුව ව්‍යාපෘතිය නිසි පරිදි භාර දීම අවශ්‍ය වේ
- ස්ථායිකරණය කිරීමෙන් පසුව RDA මඟින් නඩත්තු කටයුතු සිදු කරනු ඇත
- ඉදිකිරීම් වලදී කොන්ත්‍රාත්කරු පුද්ගලික ආරක්ෂණ උපකරණ භාවිතා කළ යුතු බව අවධාරණය කරනු ලැබේ.
- සෑම අවස්ථාවකදීම කොන්ත්‍රාත්කරු වාහන සහ පදිකයින්ගේ පහසුව සහ ආරක්ෂාව පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. මේ සඳහා, මාර්ග බාධක, රාත්‍රී කාලයේ වැඩ සඳහා කොඩි සහිත මිනිසුන් සහ විදුලි ආලෝකය සහ ප්‍රතිදීපන සහිත ආරක්ෂිත ක්‍රියාමාර්ග අනුගමනය කල යුතුය.
- ඉදිකිරීම් අපද්‍රව්‍ය / කැණීම් ද්‍රව්‍ය මගීන් පොදුජනතාවට/වාහන වලට බාධා සිදු නොවිය යුතුය

**2. දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරියෙන් පාරිසරික නිශ්කාශන සඳහා යෝජිත අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලිය**

i. ව්‍යාපෘතියට සූදානම් වීමේ අදියරේදී PMU හි පාරිසරික සමාජයීය හා සෞඛ්‍යාරක්ෂක ඒකකය විසින්, ස්ථානීය ESMP අධ්‍යනය කර ව්‍යාපෘතියට අදාළ ESMP හි ඇතුළත් අංශ සම්බන්ධයෙන් එක් එක් ව්‍යාපෘති ක්‍රියාවලිය නිසා බලපෑමට ලක්වන ගුවන් වපසරියේ විස්තර සහිතව ව්‍යාපෘති යෝජනාපත්‍රය මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලයට භාරදිය යුතුයි.

ii. මූලික තොරතුරු ප්‍රශ්නාවලියක් (BIQ) ඉහත විස්තර සමග සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය

iii. පාරිසරික සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතිය පිළිබඳ කෙටි හැඳින්වීමක් ලබාදෙන ලෙසත් පාරිසරික සහ සමාජයීය කළමනාකරණ සැලැස්ම පිළිබඳ වැඩිදුර තොරතුරුත් ඉල්ලා සිටිය හැකි අතර එය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ලබාදිය යුතුවේ.

iv. ව්‍යාපෘතිය මගින් අනුගමනය කළ යුතු ස්ථානීය කොන්දේසි වලට යටත්ව අනුමැතිය ලබාදෙනු ලැබේ

**ඇමිණුම V: අධ්‍යයන කණ්ඩායම**

| **නම** | **තනතුර** | **අධ්‍යන කණ්ඩායමේ තනතුර** |
|---|---|---|
| TDSV ඩයස් | අධ්‍යක්ෂක / ESSD/NBRO | කණ්ඩායම් නායක |
| SAMS දිසානායක | ජ්‍යෝෂ්ඨ විද්‍යාඥ /ESSD/NBRO | ජ්‍යෝෂ්ඨ පරිසර විද්‍යාඥ |
| ප්‍රභාත් ලියනාරච්චි | විද්‍යාඥ / ESSD/NBRO | පරිසර විද්‍යාඥ |
| අභීත වනසුන්දර | දිස්ත්‍රික් නිලධාරී / රත්නපුර දිස්ත්‍රික්කය | භූ තාක්ෂණ ඉංජිනේරු |
| ඉන්දු උපමාලි | විද්‍යාඥ / LRRMD/NBRO | භූ විද්‍යාඥ |
| H කුසලසිරි | තාක්ෂණික නිලධාරී /ESSD/NBRO | GIS/ජනවිකාස දත්ත / සමීක්ෂණ සහායක |

**ඇමිණුම VI:** යොමු ලැයිස්තුව

1. කැටන්දොළ නායයාම් අනතුර හා සමන්ධ NBRO භූමි පරීක්ෂණ වාර්තාව – (Ref. Report No. NBRO/313500/06/RDO (L1)/17/074)
2. පාරිසරික සහ සමාජයීය කළමනාකරණ සැලසුම ක්‍රියාත්මක කිරීමට කොන්ත්‍රාත්කරු සතු වගකීම ප්‍රකාශය-AIIB
3. පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුව - ශ්‍රී ලංකා නාය අනතුරු අවම කිරීමේ ව්‍යාපෘතිය _AIIB
4. නැවත පදිංචි කිරීම් සැලසුම්කරණ රාමුව ශ්‍රී ලංකා නාය අනතුරු අවම කිරීමේ ව්‍යාපෘතිය _AIIB